
# සන්නසහිත පිරිත් තුන් සූත්‍රය.



පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමිපාණෝ
පූජ්‍ය නාරද හිමිපාණෝ
පූජ්‍ය පියදස්සී හිමිපාණෝ
පූජ්‍ය මාගන්දනමුල්ලේ බුද්ධසෝම හිමිපාණෝ

බෞද්ධ ග්‍රන්ථප්‍රකාශන සමිතිය
දම්පසක් අංක 202 – 203

Scanned with CamScanner

දම්සක් පොත් පෙළ
අංක 202

# සන්න සහිත
# පිරිත් තුන් සූත්‍රය

පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමිපාණෝ

පූජ්‍ය නාරද හිමිපාණෝ

පූජ්‍ය පියදස්සි හිමිපාණෝ

පූජ්‍ය මාගන්දනමුල්ලේ බුද්ධසෝම හිමිපාණෝ

බෞද්ධ ග්‍රන්ථප්‍රකාශන සමිතිය.
තැ. පෙ. 61,
54, සංඝරාජ මාවත,
මහනුවර.

2540
1996

Scanned with CamScanner

# පෙර වදන

අපගේ දම්සක් පොත් පෙළේ ගිහි - පැවිදි වියතුන් අතින් නොයෙක් මාතෘකා අනු ව ලියවුණු පොත් 201 ක් දැනට පළකොට ඇත.

තුන් සූත්‍රය එක පොතක් වශයෙන් මුද්‍රණය වුණොත් පහසුවෙන් ළඟ තබා ගෙන කියවන්නට, වනපොත් (පාඩම්) කැර ගන්නට හැකි වන හෙයින් එබඳු පොත් පොඩියක් ලබා දෙන ලෙස අපේ පාඨකයන් බෞද්ධ ග්‍රන්ථප්‍රකාශන සමිතියට දැනුම් දී ඇත. ඒ ඉල්ලීම පරිදි අපගේ දම්සක් පොත් පෙළේ 202 වන අංකය ලෙසට මේ තුන් සූත්‍රය මුද්‍රණය කරවන්නට අදහස් කළෙමු.

අපේ රටේ බොහෝ අවස්ථාවල දී බොහෝ තැන්-වලදී සජ්ඣායනය කෙරෙන්නේ තුන් සූත්‍රය බව කවුරුත් දනිති. එහෙයින්, තුනුරුවන් වදින පාළි පාඨත් ඇතුළු තේරුම් සහිත මංගල, රතන, කරණීය මෙත්ත යන තුන්සූත්‍රයත්, ගිහි ගෙවලට බොහෝ විට වුවමනා වන අංගුලිමාල සූත්‍රයත් මෙහි ඇතුළත් ව ඇත. ''මහ පිරිත'' ගැන හැඳින්වීමක් සහ පිරිත් සජ්ඣායනය ගැන කෙටි විස්තරයක් ද ඇත. දම්සක් පොත් පෙළේ අංක 50 - 51 හැටියට පළවී ඇත්තේ ද කරණීය මෙත්ත සූත්‍රය යි. එය පරම පූජ්‍ය පැළෑණේ වජිරඤාණ මහනාහිමිපාණන් විසින් ලියන ලද්දකි. ප්‍රවීණයනටත් ගැලපෙන පරිදි වචනාර්ථ සහ ධර්මාර්ථ මැනැවින් පැහැදිළි කෙරෙමින් ලියන ලද ඒ කරණීය මෙත්ත සූත්‍රය බණ උගන්නවුනට බෙහෙවින් උපකාර වේනුවා ඇත.

Scanned with CamScanner

මෙ සමඟ ඇති කරණීයමෙත්ත සූත්‍ර විවරණය අභිධර්ම විශාරද අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහනාහිමි-පාණන් විසින් ලියන ලද්දකි. සාමාන්‍ය ජනතාවට අවශ්‍ය කරුණු, (බණ කතාත් ඇතුළු කොට) සරල බසින් ලියා ඇති හෙයින් එය මෙහි ඇතුළත් කළෙමු. චන්‍ද්‍රවිමල මාහිමිපාණෝ මෙසේ ද ලියති: "අන් හැම සූත්‍රයකටම වඩා ලස්සනට, මිහිරියට කියහැකි සූත්‍රය කරණීය ය. එහි වඩාත් වශීකරණ බලය ඇත්තේ ඒ නිසාය. වෘත්තය නොබිඳ නියම තාලයට මේ සූත්‍රය කියන්නට පුරුදුකර ගත යුතුය. මේ ගාථා මන්ත්‍ර කියන තාලයට වේගයෙන් නො කිය යුතුය."

හෙළ පඬිරුවනක් වූ ගුරුළුගෝමීන් අමාවතුර නමැති ග්‍රන්ථ රත්නය ලියා කළ ප්‍රාර්ථනය ද මෙතැනට අනුචිත නොවන හෙයින් සඳහන් කරනු රිසියෙමු.

බුදු ගුණ මුත් තෙපුල්
මෙත් බහා වුත් මුත් සිත්
නො වෙවා කෙණෙක්හි දූ
පරවැඩ මුත් පියෝ මා.

මාගේ වචන බුදු ගුණයෙන් තොර නො වේවා !
මාගේ සිත මෛත්‍රී භාවනාවෙන් - තොර නො වේවා !
මාගේ ක්‍රියා (ප්‍රයෝග) මොහොතක්වත්
පරවැඩෙන් - අනුනට කරන සේවාවෙන් - තොර නො වේවා !

අපිදු මේ ප්‍රාර්ථනාව පුරුදු කරමු. අපටත් අනුනටත් එයින් වැඩක් ම, යහපතක් ම සිදු වෙනවා ඇත.

Scanned with CamScanner

බෞද්ධ ග්‍රන්ථප්‍රකාශන සමිතිය මේ පොත සකස් කළ වියතුනට පින් පිරිනමයි. බෞද්ධ ග්‍රන්ථප්‍රකාශන සමිතියේ අ. ග. සි. කාරියවසම් මහත්මා විසින් දම්සක් සංස්කරණයෙහි ලා දෙනු ලබන නොමද සහාය අපි ඉතාමත් අගය කොට සලකමු.

මෙයට,

**පියදස්සි නායක මාහිමි**
(දම්සක් සංස්කාරක)

Scanned with CamScanner

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

# මංගල සූත්‍රය

බම්බලපිටියේ වජිරාරාමාධිපති ව වැඩ විසූ
පූජ්‍ය නාරද මාහිමිපාණන් විසිනි.

එවං මෙ සුතං

**එකං සමයං** භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

බහූ දෙවා මනුස්සා ච - මඞ්ගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං - බ්‍රෑහි මඞ්ගලමුත්තමං

1. අසෙවනා ච බාලානං - පණ්ඩිතානං ච සෙවනා
   පූජා ච පූජනීයානං - එතං මඞ්ගලමුත්තමං

2. පතිරූපදෙසවාසො ච - පුබ්බෙ ච කතපුඤ්ඤතා
   අත්තසම්මාපණිධි ච - එතං මඞ්ගලමුත්තමං

Scanned with CamScanner

3. බාහුසච්චං ච සිප්පං ච - විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා - එතං මඞ්ගලමුත්තමං

4. මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහො
අනාකුලා ච කම්මන්තා එතං මඞ්ගලමුත්තමං

5. දානං ච ධම්මචරියා ච – ඤාතකානං ච සංගහො
අනවජ්ජානි කම්මානි – එතං මඞ්ගලමුත්තමං

6. ආරති - විරති පාපා – මජ්ජපානා ච සඤ්ඤමො
අප්පමාදො ච ධම්මෙසු - එතං මංගලමුත්තමං

7. ගාරවො ච නිවාතො ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලෙන ධම්මසවනං - එතං මංගලමුත්තමං

8. ඛන්ති ච සොවචස්සතා - සමණානං ච දස්සනං
කාලෙන ධම්මසාකච්ඡා - එතං මංගලමුත්තමං

9. තපො ච බ්‍රහ්ම චරියං ච - අරියසච්චාන දස්සනං
නිබ්බානසච්ඡිකිරියා ච - එතං මංගලමුත්තමං

10. ඵුට්ඨස්ස ලොකධම්මෙහි · චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං - එතං මංගලමුත්තමං

11. එතාදිසානි කත්වාන - සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං - තෙසං
මංගලමුත්තමන්ති.

## මංගල සූත්‍රයේ නිදානය:

මනුෂ්‍යයන් **අතර මංගල** යනු කුමක්දැයි වාදයෙක් ඇති විය. අයෙක් අලුයම දක්නා **සුභ** දෙය මංගලයයි කීහ. ඇතැම්හු **පිරුණු** යන ආදී අලුයම **අසනා** සුභ දෙය මංගලය යි කීහ. සමහරු එසේ නො ව නැහැය, දිව, කය යන ඉඳුරන්ගෙන් **විඳිනා** දෙය මංගලයයි කීහ. මෙසේ **දිට්ඨ, සුත, මුත** වශයෙන් 'මංගල' තුන් කොටසකට බෙදමින් පිරිස භින්න වූහ. දෙව්ලොව කරා මේ මංගල කෝලාහලය ගියේලු. දෙවියෝ ශක්‍රයා අතින් මෙය විතාළහ. සක් දෙව් තෙමේ එක්තරා දෙවතාවකු කැඳවා සැවැත් නුවර අනේපිඬු සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩ වසන බුදුරජාණන් වහන්සේ කරා ගොස් විමසන්නැයි යැවී. එලෙසින් ඒ දිව්‍ය පුත්‍රයා පෙරයම ඉක්ම ගිය රාත්‍රියෙහි ඉතා සිත්කලු ශරීර වණ් ඇත්තේ මුළු දෙව්රම් වෙහෙර හාත්පසින් බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැනට එළැඹි-යේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක්හි සිට,

> **බහූ දෙවා මනුස්සා ච – මංගලානි අචින්තයුං**
> **ආකංඛමානා සොත්ථානං – බ්‍රැහි මංගලමුත්තමං**

යනුවෙන් ''සැපතක් බලාපොරොත්තු වන්නා වූ බොහෝ දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද මංගල කාරණයන් සිතූහ. ඒ උතුම් මංගලය වදාළ මැනැවැ''යි සැළ කෙළේය.

සෙත් බව පසස්මින් - බොහෝ දෙවියො ත් මිනිස්සු ත්
මඟුල් කිමදැයි විමැසූ - කිව මැන ඉන් මඟුලු'තුම්

Scanned with CamScanner

සුව පතනා බොහෝ මුරුගණ මනු දනද
ලොව සුමඟුල් කිමැයි සිතුවෝ නොයෙක් ලෙද
ඉවසිලි නැතිවැ සෙවුවත් නොදතු තතු ලෙද
පැවසුව මැනැවි ඒ මඟුල් තතුසෙ පිරි සිඳ

ඉක්බිති බුදුරජහු:

1 **අසෙවනා ච බාලානං - පණ්ඩිතානං ච සෙවනා**
**පූජා ච පූජනීයානං - එතං මංගලමුත්තමං**

යන ආදී වශයෙන් මංගල කාරණයන් අටතිසක් (38) වදළහ.

මෙලොව පරලොව යහපතට හෙතු වූ කරුණු මංගල නම්. **මං** යනු නිරයට නමෙකි. **ග** යනු ගමනාර්ථයෙහි වැටේ. **ල** යනු කපන්නා යන අර්ථයි. එහෙයින් මංගල යන්නෙන් **නිරයට යන මග කපන හෙවත් වළක්වන** (කරුණු) යන අර්ථයක් ප්‍රකාශ වේ.

**මගි** ධාතුයෙන් කරණාර්ථයෙහි **අල** ප්‍රත්‍යය වී මංගල ශබ්දය සිඩයි. **දියුණුව කරා** යැමට ඉවහල් වූ **යහපත්** දේ යනු එහි නිර්වචනයි.

පළමු ගාථාව :- බාලයන් සේවනය නොකිරීම ද, පණ්ඩිතයන් සේවනය කිරීම ද, පිදිය යුත්තන් පිදීම ද යන මේ දේ උතුම් මඟුලි.

නො සෙවුම් අඳබලන් - පඬුවන් සෙවුම් කැරුමුත්
පිදිය යුත්තන් පිදුමුත් - යන මෙතුනු'තුම් මඟුලි.

Scanned with CamScanner

2 **පතිරූපදෙසවාසො ච - පුබ්බෙ ච කතපුඤ්ඤතා**
**අත්තසම්මාපණිධි ච - එතං මංගලමුත්තමං**

සුදුසු දෙස විසුමත් - පෙර කළ පින් ඇති බවත්
සිත් නිසි ලෙස පිහිටුමත් - මෙතුන ද උතුම් මඟුලී.

සුදුසු දෙශයන්හි වාසය ද, පෙර කරන ලද පින් ඇති බව ද, සිත් - සතන් හෝ ආත්ම භාවය හෝ මනා කොට පිහිටුවා ගැනීම ද යන මේ දේ උතුම් මඟුලී.

3 **බාහුසච්චං ච සිප්පං ච - විනයො ච සුසික්ඛිතො**
**සුභාසිතා ච යා වාචා - එතං මංගලමුත්තමං**

බොහෝ ඇසූ පිරූ බව - සිප් සහ මනා හික්මුම
සුබැසි බස් දැයි යන මේ - සතර ද උතුම් මඟුලී.

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද, ශිල්පය ද, මනා කොට හික්මෙන ලද විනය ද, මනා කොට කී යම් බසෙක් වේ නම් එය ද යන මේ උතුම් දේ මඟුලී.

4 **මාතාපිතුඋපට්ඨානං - පුත්තදරස්ස සංගහො**
**අනාකුලා ච කම්මන්තා - එතං මංගලමුත්තමං**

දෙමාපිය උවටැන් - අඹුදරුවනට සඟහත්
නිරවුල් කිරිය දැයි යන - මෙ තුන ද උතුම් මඟුලී.

මවුපියන්හට උපස්ථාන කිරීම, අඹු - දරුවනට සංග්‍රහ කිරීම, නිරවුල් කර්මාන්තයන්හි යෙදීම යන මේ දේ උතුම් මඟුලී.

5 **දානං ච ධම්මචරියා ච - ඤාතකානං ච සංගහො**
**අනවජ්ජානි කම්මානි - එතං මංගලමුත්තමං**

දනුත් දම්සර හා - නෑයනට නිසි සඟහ ත්
හරි රැකියා නියුතුව ද යන - මෙ තුන ද උතුම් මඟුලි.

දන් දීම ද, දශකුශල ධර්ම යන්හි, හැසිරීම ද නෑයනට සංග්‍රහ කිරීම ද, නිවැරැදි වූ කර්මාන්ත කිරීම ද - යන මේ දේ උතුම් මඟුලි.

**6 ආරති – විරති පාපා – මජ්ජපානා ච සඤ්ඤමො**
**අප්පමාදො ච ධම්මෙසු – එතං මංගලමුත්තමං**

පවින් වැළැකීමත් - මත්පැනින් තොර වීමත්
නොපමාවත් කුසල්හී - යන මේ උතුම් මඟුලී.

පාපයෙන් ඈත් වීම - වැළැකීම ද, මත්පැන් පීමෙන් වැළැකීම ද, දශ කුශල ධර්මයන්හි අප්‍රමාද වීම ද යන මේ දේ ද මඟුලි.

**7 ගාරවො ච නිවාතො ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා**
**කාලෙන ධම්මසවනං - එතං මංගලමුත්තමං**

ගෙර නිවත් වැටුමු ත් - සතුට කළගුණ දැනුමුත්
නිසි කලැ බණ ඇසුම් දැයි - මෙ පස ද උතුම් මඟුලී

ගරු කිරීම ද, යටත් පැවතුම් ඇති වීම ද, ලද දෙයින් සතුටු වීම ද, කෙළෙහිගුණ දන්නා බව ද, සුදුසු කාලයෙහි බණ ඇසීම ද යන මේ දේ උතුම් මඟුලි.

**8 ඛන්තී ච සොවචස්සතා - සමණානං ච දස්සනං**
**කාලෙන ධම්මසාකච්ඡා - එතං මංගලමුත්තමං**

ඉවැසුම සුවච බව - මහණුන් දැක්ම සිල්වත්
නිසි කලැ දහම් විමසුම - මෙ සතර උතුම් මඟුලී.

Scanned with CamScanner

ඉවැසීම ද, කීකරු බව ද, ශීලසම්පන්න ශ්‍රමණයන් වහන්සේ දැකීම ද, සුදුසු කාලයෙහි ධර්ම සාකච්ඡාව ද යන මේ දේ උතුම් මඟුලි.

9 **තපෝ ච බ්‍රහ්මචරියංච – අරියසච්චානදස්සනං**
**නිබ්බානසච්ඡිකිරියා ච – එතං මංගලමුත්තමං**

තවසත් බඹසර ත් - සිව් අරිසස් දැකීම ත්
මොක් සිරි පසක් කරනුත් - මෙ සතර උතුම් මඟුලී

තපස ද, උතුම් හැසිරීම ද, ආර්‍ය සත්‍යයන් දැකීම ද, නිවන් සාක්‍ෂාත් කර ගැනීම ද යන මේ දේ උතුම් මඟුලි.

10 **ඵුට්ඨස්ස ලොකධම්මෙහි - චිත්තං යස්ස න කම්පති**
**අසොකං විරජං ඛේමං - එතං මංගලමුත්තමං**

ලෝ දමින් පැහැසුණු - යමකු සිත නො සැලේ නම්
අසෝ විරා කෙම් නම් - මෙ සතර උතුම් මඟුලී.

යමකුගේ සිත ලෝක ධර්මයන් විසින් ගටනා ලද්දේ එයින් කම්පා නො වේ ද, ශොක රහිත වේ ද, කෙලෙස් දූවිලි නොමැති වේ ද, ක්‍ෂෙම ද හෙවත් භය නැති ද යන මේ දේත් උතුම් මඟුලි.

මේ ගාථායෙන් ද මංගල කරුණු සතරක් වදරා,

**එතාදිසානි කත්වාන**
**සබ්බත්ථමපරාජිතා**
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං**
**තෙසං මංගලමුත්තමං ති**

මෙ බඳු දෑ පිළිපැදෑ - හැම තැනැ ම නො පැරැදුණෝ
හැම තැනැ සෙතට පැමිණෙත්-ඔවුනට හේ මඟුල් වේ.

යනුවෙන් මෙවැනි මංගලයන් කොට හැම තැන්හි ම පරාජය නොවී සියලු තැන්හි සැපතට යෙති. ඔවුනට එකී අට තිස් මංගල කරුණු ම උතුම් මඟුලී යි තථාගතයන් වහන්සේ සූත්‍රය අවසන් කළ සේක. දේශනාවසානයෙහි බොහෝ දෙනෙක් මාර්ග ඵලවලට පැමිණියහ.

❋

Scanned with CamScanner

# රතන සූත්‍රය

පූජ්‍ය මාගන්දනමුල්ලේ බුද්ධඝෝෂ හිමියන් විසිනි.

1. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
සබ්බෙව භූතා සුමනා භවන්තු
අථො'පි සක්කච්ච සුණන්තු භාසිතං

2. තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය
දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං
තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

4 ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි

Scanned with CamScanner

ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

5. යම්බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

6. යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

7. යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනො ගොතමසාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

8. යථින්දඛීලො පඨවිං සිතො සියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියො
තථූපමං සප්පුරිසං වදමි
යො අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

Scanned with CamScanner

9. යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

10. සහාවස්සදස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වා පියදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡචාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

11. කිඤ්චා'පි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බො සො තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

12. වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

Scanned with CamScanner

13. වරො වරඤ්ඤූ වරදෙ වරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයී
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපො
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු.

16 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව දන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු.

17. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු.

Scanned with CamScanner

## රතන සූත්‍රයේ නිදාන කථාව

තථාගතයන් වහන්සේ රජගහ නුවර වැඩ වාසය කරන සමයෙහි රෝග භය, දුර්භික්ෂ භය සහ අමනුෂ්‍ය භය යන භය තුනක් දඹදිව විශාලා මහ නුවරෙහි පහළ විය. එවිට ලිච්ඡවි රජවරු එය සංසිඳවා ගැනීම සඳහා කුමක් කළ යුතු දැයි මැති ඇමති ආදී ප්‍රභූන් සමඟ සාකච්ඡා කළහ. එහිදී අන්‍ය ලබ්ධික ඇතැම් අය පූරණ-කාශ්‍යපාදී ෂට් ශාස්තෘන්ගේ ගුණ කියා ඔවුන් නුවරට කැඳවීමට යෝජනා කළ මුත් බොහෝ දෙනාගේ අදහස වූයේ ජාති - කුල - ගෝත්‍රාදී කිසිම භේදයක් නොසලකන, ගුණගරුක, සියලු සතුන් වෙත පතළ මහා කරුණාවෙන් යුතු, විචිත්‍ර කථිකත්වයකින් හෙබි, රාග - ද්වේෂ - මෝහාදී සියලු කෙලෙස්නැසූ, අනූපම රූප ශෝභාවකින් හා මහා ප්‍රඥාවකින් යුක්ත වූ, ගෞතම බුදු රජාණන් වහන්සේ තම රටට වැඩමවා ගැනීමසුදුසු බවය.

ඒ අනුව සපරිවාර ලිච්ඡවි රජවරු රජගහ නුවරට ගොස් තම රටට සිදුව ඇති මහා විපත්තිය සැළකර අසරණ ජනතාවට හිත සැප පිණිස විශාලා නුවරට වැඩම වන ලෙස භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළහ.

මහා කරුණාවෙන් යුත් තථාගතයන් වහන්සේ තමන් වහන්සේ එහි වැඩමවා ආශීර්වාද කිරීමෙන් හා දහම් දෙසීමෙන්, බොහෝ දෙනාටත් මුළු රටටත් විශාල සෙතක් - ශාන්තියක් සිදු වන බව දැන, ඇරයුම පිළිගෙන වැඩීමට සූදනම් වූ සේක.

Scanned with CamScanner

ඒ බව දැනගත් බිම්බිසාර රජතුමා රජගහ නුවර සිට ගංගා නදිය දක්වා යොදුන් පහක් දුර මග මනා ලෙස සකස් කරවා, වැලි අතුරුවා, ධජ - පතාක නංවා, මහත් පුද පෙරහරින් රහතන් වහන්සේලා පන්සියයක් සමග බුදු රජාණන් වහන්සේ දින පහකින් ගං තෙරට වැඩමවූහ.

එහිදී නැව් දෙකක් එකට සම්බන්ධ කොට සරසා එහි මාහැඟි අසුන් පනවා බුදුපාමොක් මහ සඟන වඩා හිඳුවා රජතුමා නැවැතිණ. මහත් පූජා සත්කාර සහිත ව තථාගතයන් වහන්සේ යොදුනක් පමණ දුර ගඟ පහළට නැවෙන් වැඩමවන ලදුව විශාලා නුවරට අයත් ගංගා තීරයෙහි ගොඩ බිමට වැඩි සේක. එකෙණෙහි ම විශාලා නුවරට ධාරානිපාත මහ වැසි ඇති විය. එම වර්ෂාව නිසා, නුවර තැනින් තැන දමා තිබුණු මළ මිනී සහ වෙනත් සතුන්ගේ මළ කුණු ද ජල පහරින් ගඟට ගසා ගෙන ගියෙන් නුවර භූමිය පිරිසිදු විය. දුගඳ පහ විය, විෂබීජ සේදී ගියේය.

මහ පිරිවරින් යුත් ලිච්ඡවී රජ දරුවන් යොදුනෙන් යොදුන ස්ථාන තුනක සැපපහසුකම් - වලින් අනූන තානායම් ඉදි කරවා එහිදී මහදන් දී තුන් දිනක් ඇවෑමෙන් විශාලා මහ නුවරට බුදු පාමොක් මහ සඟන වැඩමවන ලදහ. එම අවස්ථාවේදී මහත් දිව්‍ය සේනාවක් පිරිවැරූ ශක්‍ර දිව්‍ය රාජයා ද එම නුවරට පැමිණියේ ය. දෙවියන්ගේ රැස් වීම නිසා එතෙක් බලය පතුරුවා ගෙන සිටි අමනුෂ්‍ය සමූහයා නුවරින් බැහැරට පළා ගියහ.

භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන් අමතා, "ආනන්දය, බොහෝ දෙනාට සෙත් පිණිස මේ රතන සූත්‍ර දේශනාව උගෙන දෙවියන්ට කරන පුද පූජාදිය

ගෙන්වා ගෙන, ලිච්ඡවී කුමාරවරුන් සමග නගරය වටා පිහිටි පවුරු තුන අතර සැරිසරමින් පිරිත් සජ්ඣායනා කරවයි'' නියම කළ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේගේ පූජනීය පාත්‍රයට පිරිසිදු පැන් ගෙන රතන සූත්‍රයෙන් පිරිත් බැණ, ආරක්ෂාව පිණිස මුළු නුවර ම පිරිත් පැන් ඉසිමින්, සජ්ඣායනා කරමින් සැරිසැරූහ. තැනින් තැන සැඟවී සිටි අමනුෂ්‍යයෝ ද පිරිත් දෙසීම හා පිරිත් පැන් ඉසීමෙන් බියට පත් ව පලා ගියහ.

මහජනයා නුවර මැද රැස්වීම් ශාලාව පිරිසිදු කොට, උඩු වියන් බැද, පහන් දල්වා, සුවඳ දුම් අල්වා, මල් බඳුන් සහ පැන් තබා අසුන් පැනවූ කල්හි එහි වැඩියා වූ තථාගතයන් වහන්සේ සහ සෙසු භික්ෂූහු සුදුසු අසුන්වල වැඩ හුන්හ.

පිරිත් පැන් ඉස නගරයට ආරක්ෂාව සැලසූ අනඳ හිමිපාණෝ ද ලිච්ඡවී රජ දරුවෝ සහ නගර වාසීහු ද රැස්වීම් ශාලාවට පැමිණ තමතමන්ට සුදුසු අසුන්වල හුන්හ. සක් දෙව්දු ඇතුළු විශාල දේව පිරිස් ද රැස් වූහ. එහිදී තථාගතයන් වහන්සේ සියල්ලන්ට ම මේ රතන සූත්‍රය දේශනා කළ සේක.

තථාගතයන් වහන්සේ යළිත් දෙවන දින පටන් සත්වන දින තෙක් දිනකට වර බැගින් හත් වාරයක් ම රතන සූත්‍රය දේශනා කළ බව අටුවාවෙහි සඳහන් වේ.

සක් දෙව්දු ''අපිත් මේ රටවාසීන්ට සෙත් පතා යමු''යි සිතා රැස් ව සිටි සෙසු දෙවියන් සමග, බුධ

රත්නය, ධර්ම රත්නය හා සඞ්ඝ රත්නය වැඳ සෙත් පතා රචිත සූත්‍රයේ අවසාන ගාථා තුන කියා දෙව් ලොවට ගියේය.

එතැන් පටන් පැතිරී තිබුණු අමනුෂ්‍යය භය දුරු වූ අතර, රෝග භය ද දිනෙන් දින අඩු විය. දුර්භික්ෂ භය ද ක්‍රමයෙන් අඩු ව ගොස් නොබෝ කලකින් මුළු රටට ම සෞභාග්‍ය උදා විය.
මෙහි ගාථාවලින් කෙරෙන ආඥාව කෝටි ලක්ෂයක් සක්වල දෙවියන් විසින් පිළිගන්නා ලදැයි සඳහන් වේ.

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ**
**සබ්බෙව භූතා සුමනා භවන්තු**
**අථො'පි සක්කච්ච සුණන්තු භාසිතං**

මෙහි බිම හෝ අහසෙහි හෝ රැස් වූ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත් ද, ඒ සියලු ම භූතයෝ යහපත් සිත් ඇත්තෝ වෙත්වා! තවද මතු කියන ප්‍රකාශය එකඟ සිතින් මනා ලෙස අසත් වා!

**තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ**
**මෙත්තං කරොථ මානුසියා පජාය**
**දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං**
**තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා**

එහෙයින් සියලු භූතයනි, මැනවින් ඇහුම්කන් දෙන්න: යම් කෙනෙක් දවල්හි හෝ රාත්‍රියෙහි හෝ ඔබ වෙත පූජාවන් සපයත් ද හෙවත් පින්පෙත් දෙත් ද, ඒ මිනිස් ප්‍රජාව කෙරෙහි මෙත්සිත් පතුරුවන්න; නො පමාව ඔවුන් ආරක්ෂා කරන්න.

Scanned with CamScanner

යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං
නපිනො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

මේ ලොවැ හෝ පරලොවැ හෝ යම් කිසි උසස් ම වස්තුවක් වේද, ස්වර්ගයන්හි හෝ මාහැඟි යම් රත්නයක් වේද, ඒ රත්න අතර බුද්ධ රත්නයට සමාන උතුම් රත්නයක් නැත. මෙය සම්බුදුන් කෙරෙහි ඇති ශ්‍රෙෂ්ඨ රත්න භාවය යි. මේ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

සිතේ උපරි ම එකඟතාවයකින් යුක්ත වූ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ, රාගාදී සියළු කෙලෙස් නැති කිරීමෙන්, උතුම් වූ යම් නිර්වාණ ධර්මයක් අවබෝධ කළ සේක් ද, ඒ ධර්මය හා සම වූ අන් කිසිදු ධර්මයක් නැත. මෙය ද ධර්මය කෙරෙහි ඇති ශ්‍රෙෂ්ඨ රත්න භාවය යි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

Scanned with CamScanner

බුඩ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ, කෙලෙස් මළ නසා, සිත පිරිසිදු කරන යම් මාර්ග ධර්මයක් වර්‍ණනා කළ සේක් ද, මාර්ගයට අනතුරුව ම ඵලය ලැබෙන හෙයින් යම් ඵල සමාධියක් ආනන්තරිකයයි වදාළ සේක් ද, ඒ ඵල සමාධිය හා සම වූ අන් රුවනක් නැත. මෙය ද ධර්මය කෙරෙහි ශ්‍රෙෂ්ඨ රත්න භාවයයි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**යෙ පුග්ගලා අට්ඨසතං පසත්‍ථා**
**චත්තාරි එතානි යුගානි හොන්ති,**
**තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා**
**එතෙසු දින්නානි මහප්ඵලානි**
**ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

බුද්ධාදී සත් පුරුෂයන් විසින් ප්‍රශංසා කරනලද යම් ආර්‍ය්‍ය පුද්ගලයින් අට දෙනෙක් වෙත්ද, ඒ පුද්ගලයෝ යුගල වශයෙන් සතරෙකි. බුද්ධ ශ්‍රාවක වූ ඔවුහු පරලොව කම්පල අදහාගෙන දෙනු ලබන සිව් පසය ලැබීමට සුදුස්සෝ වෙති. උන් වහන්සේලා කෙරෙහි දුන් දන මහත් ඵල වේ. මෙයද සංඝයා කෙරෙහි ශ්‍රෙෂ්ඨ රත්න භාවය වේ. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන**
**නික්කාමිනො ගොතමසාසනම්හි**
**තෙ පත්තිපත්තා අමතං විගය්හ**
**ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා**
**ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

Scanned with CamScanner

ගෞතම ශාසනයෙහි යම් ශ්‍රාවක කෙනෙක් දැඩි සිතින් පිළිවෙත් පිරිමෙහි යෙදී කෙලෙසුන්ගෙන් මිදුනාහු වෙත් ද, ඔවුහු පැමිණිය යුතු රහත් ඵලයට පැමිණ මරණයක් නැති හෙයින් අමෘත නම් වූ නිවනට බැස නොමිළයේ ම ලද නිවන් සුව වළඳන්නාහු වෙති. මෙය ද සඞ්ඝයා කෙරෙහි ඇති ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**යථින්‍දඛීලො පඨවිං සිතො සියා**
**චතුබ්භි වාතෙහි අසම්පකම්පියො**
**තථූපමං සප්පුරිසං වදමි**
**යො අරියසච්චානි අවෙච්ච පස්සති**
**ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

පොළවෙහි ගැඹුරට හිට වූ ඉන්ද්‍ර කීලයක් (කනුවක්) යම් සේ සිව් දිගින් හමන සුළඟින් නො සෙල්වේ ද ආර්‍ය්‍ය සත්‍යයන් මාර්ග ඥානයෙන් අවබෝධ කොටැ දකින සත් පුරුෂයා ද එබඳු යයි කියමි. මෙය ද සඞ්ඝයා කෙරෙහි ඇති ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**යෙ අරියසච්චානි විභාවයන්ති**
**ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි**
**කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා**
**න තෙ භවං අට්ඨමං ආදියන්ති**
**ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

Scanned with CamScanner

ගැඹුරු ප්‍රඥාවක් ඇති තථාගතයන් වහන්සේ විසින් මනා කොටැ දේශනා කරන ලද්ද වූ, ආය්‍ය්‍ය සත්‍යයන් යම් පුද්ගල කෙනෙක් පළමු මාර්ග ඥානයෙන් දකිත් ද, ඔවුහු සසර බොහෝ ප්‍රමාද වූවාහු නමුදු අටවැනි භවයක් උත්පත්ති වශයෙන් නො ගනිත්. මෙය ද සඞ්ඝරත්නය කෙරෙහි ඇති ශ්‍රෙෂ්ඨ රත්න භාවය වේ. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**සහාවස්සදස්සනසම්පදය**
**තයස්සු ධම්මා ජහිතා භවන්ති**
**සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච**
**සීලබ්බතං වා'පි යදත්ථි කිඤ්චි**
**චතූහපායෙහි ච විප්පමුත්තො**
**ඡචාභිඨානානි අභබ්බො කාතුං**
**ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

සෝවාන් වීමත් සමග ම ඒ ආය්‍ය්‍ය පුද්ගලයාට සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත - පරාමාස යන කෙලෙස් බැමි තුන සිතින් බැහැර වූවාහු වෙති. එසේ ම සතර අපායෙන් මිදුනෙක් ද වේ. පඤ්ච ආනන්තරිය කර්ම කිරීමට හා නියත මිථ්‍යා දෘෂ්ටිය ගැනීමට ඔහු නුසුදුස්සෙක් වේ, හෙවත් ඔහුගෙන් ඒවා සිදු නො වේ. මෙය ද සඞ්ඝයා කෙරෙහි ඇති ශ්‍රෙෂ්ඨ රත්න භාවය වේ. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**කිඤ්චා'පි සො කම්මං කරොති පාපකං**
**කායෙන වාචා උද චෙතසා වා**
**අභබ්බො සො තස්ස පටිච්ඡාදය**
**අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා**

Scanned with CamScanner

**ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

තවද හෙතෙම කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ පාප කර්මයක් කරයිද, හෙතෙම ඒ පාප කර්මය වැසීමට නුසුදුස්සෙක් වේ. හේතුව සෝවාන් තැනැත්තාගේ ස්වභාවය කරනලද අකුසලය නොසැඟවීම බැවිනි. මෙය ද සඞ්ඝයා කෙරෙහි ඇති ශ්‍රෙෂ්ඨ රත්න භාවයකි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ**
**ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ**
**තථූපමං ධම්මවරං අදෙසයී**
**නිබ්බානගාමිං පරමං හිතාය**
**ඉදම්පි බුද්ධෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

ග්‍රීෂ්ම ඍතුවෙහි පළමුවන මාසයෙහි පිපුණු මල්වලින් ගැවසුණු තුරු මුදුන් ඇති වන ගොමුවක් යම් සේ වේද? එය උපමා කොටැ'ති පිළිපැදීමෙන් නිවනට පමුණුවන්නා වූ ධර්මය සත්ත්වයින්ට හිත පිණිස දෙසූ සේක. මෙය ද බුද්ධ රත්නය කෙරෙහි ඇති ශ්‍රෙෂ්ඨ වූ රත්න භාවයකි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

**වරො වරඤ්ඤූ වරදෙ වරාහරො**
**අනුත්තරො ධම්මවරං අදෙසයී**
**ඉදම්පි බුද්ධෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු.**

උත්තම වූ ද, නිර්වාණ ධර්මය දන්නා වූ ද, එම ධර්මය සත්ත්වයින්ට දෙන්නා වූ ද, නිවන් ලැබීමේ ප්‍රතිපදාව

Scanned with CamScanner

දේශනා කරන්නා වූ ද, අනුත්තර වූ තථාගතයන් වහන්සේ උතුම් වූ ධර්මයක් දෙසූ සේක. මෙය ද සම්බුදුන් කෙරෙහි ඇති ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා'යම් පදීපො:
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

රහතන් වහන්සේගේ පැරණි කර්ම ගෙවී ගියේ ය. අලුත් කර්ම හට ගැනීමක් ද නැත. පුනර්භවය ලැබීම සඳහා කිසිම ඇලීමක් ද නැත. බොල් වූ විපාක නොදෙන කර්ම බීජ ඇත්තේ ය. සසර ගමනට කැමැත්ත නැසුවා වූ, ඒ පණ්ඩිත වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා මේ පහන මෙන් නිවී යත්. මෙය ද සඞ්ඝයා කෙරෙහි ඇති ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු.

මෙහි බිම හෝ ගුවනෙහි හෝ රැස් වූ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත්ද, ඒ අපි සැවොම දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගතයන් වහන්සේ නමදිමු. සත්නට සෙත් වේවා!

Scanned with CamScanner

.......... තථාගතයන් වහන්සේ සහ උන්වහන්සේ විසින් දේශිත ධර්මය ද නමදිමු. සත්නට සෙත් වේවා!

.......... තථාගතයන් වහන්සේ සහ උන්වහන්සේ-ගේ ශ්‍රාවක සඞ්ඝයා ද නමදිමු. සත්නට සෙත් වේවා!

❋

# කරණීය මෙත්ත සූත්‍රය

සාහිත්‍ය චක්‍රවර්ති පණ්ඩිත රේරුකානේ චන්දවිමල මහා නාහිමිපාණන් විසිනි.

1. කරණීයමත්ථකුසලෙන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කො උජූ ච සූජූ ච
සුවචො චස්ස මුදු අනතිමානි

2. සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො

3. න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි
යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං
සුඛිනො වා ඛෙමිනො හොන්තු
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

4. යෙ කෙචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසෙසා
දීඝා වා යෙ මහන්තා වා
මජ්ඣිමා රස්සකාණුකථූලා

Scanned with CamScanner

5. දිට්ඨා වා-යෙ ච අද්දිට්ඨා
යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ
භූතා වා සම්භවෙසී වා
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

6. න පරො පරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

7. මාතා යථා නියං පුත්තං
ආයුසා එකපුත්තමනුරක්ඛෙ
ඒවං පි සබ්බභූතෙසු
මානසං භාවයෙ අපරිමාණං

8. මෙත්තං ච සබ්බලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියං ච
අසම්බාධං අවෙරං අසපත්තං

9. තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවතස්ස විගතමිද්ධො
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු

10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං
නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී'ති

Scanned with CamScanner

## කරණීය සූත්‍රයේ නිදාන කථාව:

බුදු සසුන ඇති වූ මුල් කාලයේදී-එනම් බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ හා එයට සමීප කාලයේ මෙකල මෙන් ගමක් පාසා, නගරයක් පාසා භික්ෂූන් වහන්සේලාට විසීමට පන්සල් දඹදිව නො තිබිණ. හේමන්ත, ග්‍රීෂ්ම ඍතු දෙකට අයත් අට මාසයේ වැසි නැති බැවින් ඒ රටේ කොතැනත් මිනිසුන්ට විසිය හැකි විය. එකල දඹදිව භික්ෂූන් වහන්සේලා ජීවත් වූයේ ද වැසි නැති අට මාසය තුළ රටේ ඇවිදිමිනි. උන්වහන්සේලා ඇවිදීම කළේ කැලෑ, ගල්ගුහා, වතු, පිට්ටනි, ගස් මුල්, අම්බලම්, පාලු ගෙවල් ආදියෙහි දින එක-දෙක බැගින් ගත කරමිනි. එසේ ඇවිදින්නා වූ භික්ෂූන් වහන්සේලාට වර්ෂා කාලයේ විසීමට තැන් පිළියෙල කර දීමේ සිරිතක් දඹදිව වැසියන් අතර තිබිණ. බුදුරජාණන් වහන්සේ විසින් ද ඒ කාලයේ තුන් මසක් එක් තැනක වස් විසීමට නියම කර තිබුණු බැවින් වර්ෂා කාලය පැමිණෙන විට භික්ෂූහු වස් එළඹීමට සුදුසු තැන් සොයා ගනිති. බොහෝ භික්ෂූන් වහන්සේලා රහත් වී ඇත්තේ ද ඒ වස් කාලයේ එක් තැනක වෙසෙමින් භාවනා කිරීමෙනි.

බොහෝ භික්ෂූන් වහන්සේලා වස් කාලය ළං වන කල්හි ඒ කාලයේ භාවනා කොට රහත් වීමේ බලාපොරොත්තුවෙන් බුදුරදුන් වෙත පැමිණ උන්-වහන්සේගෙන් රහත් වීම දක්වා කිරීමට භාවනා ක්‍රමයක් අසා ගෙන ඒ ඒ තැන්වලට ගොස් වස් වැස භාවනා කොට, අර්හත්වයට පැමිණ දුක් කෙළවර කර ගනිති. බොහෝ ගිහියෝ ද ඒ භික්ෂූන් වහන්සේලාට උපස්ථාන

Scanned with CamScanner

කරමින් බණ අසමින් පින් රැස් කර ගනිති. ඇතැම්හු සෝවාන් ආදි මාර්ගඵල ද ලබා ගනිති. එබැවින් වස් කාලය විශේෂ පුණ්‍ය කාලයෙකි.

තථාගතයන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන අවස්ථාවක පන්සියයක් භික්ෂූන් වහන්සේලා එක් වී වස් කාලය සමීපයේදී තථාගතයන් වහන්සේ වෙත එළඹ අර්හත්වය දක්වා භාවනා කිරීමට භාවනා මාර්ගයක් අසාගෙන වස් විසීමට සුදුසු තැනක් හා ගොදුරු ගමක් සොයමින් වැඩම කළහ. ඒ භික්ෂූන් වහන්සේලාට ඈත ප්‍රත්‍යන්තයේ හිමාලය වනය හා සම්බන්ධ වී ඇති සොඳින් සෙවන දෙන අතුපතරින් ගැවසුණු මහ ගස් ඇති තැන තැත මනරම් සුදු වැලි තලා ඇති, පිරිසිදු ජලයෙන් යුත් ජලාශයක් ඇති එක් පර්වතයක් හමු විය. උන්වහන්සේලා ඒ රාත්‍රියෙහි එහි වැස පසු දින උදෑසන සමීප ගමකට පිඩු සිඟා වැඩම කළහ. ඒ ගම එකිනෙකට සමීපව පිහිටි දහසක් ගෙවල් ඇති පවුල් දහසක් වෙසෙන ගමෙකි. එගම් වැස්සෝ සැදැහැවත්හු ය. කලකින් භික්ෂූන් ඒ ගමට පැමිණ නැති බැවින් භික්ෂූන් දුටු ගම්වැසියෝ ඉතා සතුටට පත් ව උන්වහන්සේලාට දන් දී වස් විසීමට ද ආරාධනා කොට උන්වහන්සේලාට විසීම සඳහා පන්සියයක් කුටි හා ඒවාට වුවමනා උපකරණයන් ද පිළියෙල කළෝය. ඒ භික්ෂූන් වහන්සේලා පසු දින අන් ගමකට පිඩු පිණිස වැඩම කළෝය. ඒ ගම්වැසියෝ ද උන් වහන්සේලාට සත්කාර කොට වස් විසීමට ආරාධනා කළෝය.

භික්ෂූන් වහන්සේලා එහි පෙරවස් වැස තැනින් තැන ගස් යට හිඳ භාවනාවෙහි යෙදෙන්නට වූහ. ඒ

Scanned with CamScanner

වනයේ ගස්වල බොහෝ දේවතාවෝ වෙසෙති. සිල්වත් භික්ෂූන් වහන්සේලා ගස් යට වැඩ සිටින කල්හි උන්වහන්සේලාගේ සීල තේජස නිසා දෙවි-වරුන්ට ගස්වල ඔවුන්ගේ විමන්වල නොවිසිය හැකි විය. භික්ෂූන් වහන්සේලා ගස් මුලින් යන තුරු ඔවුහු තමතමන්ගේ විමන්වලින් ඉවත් ව සිටියහ. භික්ෂූන් වහන්සේලා ඒ වනයෙන් ''අද බැහැර වී යනු ඇත. සෙට යනු ඇති''යයි දෙවියෝ බලාගෙන සිටියෝය. එහෙත් එසේ නොවිණ. පසුව වස් විසූ භික්ෂූන් වස් කාලය වන තෙමස ඉක්මෙන තුරු නොයන බව තේරුම් ගත් රුක් දෙවියෝ ''මේ කරදරය අපට දිගු කලක් නොවිඳිය හැකිය. එබැවින් අපගේ මේ වනයෙන් භික්ෂූන් අස්කර දැමිය යුතු ය''යි සිතා ඒ දෙවිවරු රාත්‍රි කාලයේ භයානක වෙස් ගෙන භික්ෂූන් ඉදිරියේ පෙනී සිටින්නටත්, නපුරු භයානක ශබ්ද ඇති කරන්නටත් පටන් ගත්හ. ඒ කරදරය නිසා භික්ෂූන්ට නියම ලෙස භාවනාවෙහි නො යෙදිය හැකි විය. ඒ බිය නිසා ම උන්වහන්සේලාගේ ශරීර ද දුබල විය. එපමණකින් ද භික්ෂූන් වහන්සේලා නොයන කල්හි ඉවසා සිටිය නොහෙන තරමෙ නපුරු ගන්ධයන් ඇති කළහ. සිත් එකඟ කරගත නො හැකි ව සිටි භික්ෂූන් වහන්සේලාට ඒ ගඳින් හිසෙහි බලවත් වේදනා ඇති විය. දිනකට වරක් සඞ්ඝස්ථවිරයන් වහන්සේ වෙත එළඹීම භික්ෂූන් වහන්සේලාගේ සිරිතකි. එක් දවසක් තමන්වහන්සේ වෙත පැමිණි කල්හි කෘශ ව දුබල ව සිටින භික්ෂූන් වහන්සේලා දැක සඞ්ඝස්ථවිරයන් වහන්සේ එයට හේතුව විචාළහ. කලින් තමතමන්ට ඇති වූන ඒ කරදරය කිසි භික්ෂුවක් අන් භික්ෂුවකට

කියා නැත. විචාළ කල්හි භික්ෂූහු ඒ කාරණය මහ-තෙරුන් වහන්සේට සැල කළහ. එකල්හි මහ තෙරුන් වහන්සේ ''ඇවැත්නි, එසේ නම් මේ වනය අපට සුදුසු තැනක් නො වේ. මෙහි වෙසෙමින් අපට ශ්‍රමණ ධර්මය මස්තකප්‍රාප්ත කර ගත නොහැකිය. බුදුන් වහන්සේ විසින් පෙර වසය, පසු වසය යි වස් විසීම් දෙකක් අනුදැන වදරා ඇත්තේය. අපි බුදුන් වහන්සේ වෙත ගොස් මේ කරුණ උන්වහන්සේට දන්වා සුදුසු සෙන-සුනක් උන්වහන්සේගෙන් විචාරමුය''යි කීහ. සැම දෙනා වහන්සේ ම මහ තෙරුන් වහන්සේගේ යෝජනාවට එකඟ වී සෙනසුන් තැන්පත් කොට තබා පාසිවුරු ගෙන බුදුරදුන් දක්නට පිටත් වූහ. භික්ෂු පිරිස බුදු-රජාණන් වහන්සේ වෙත පැමිණි කල්හි ''මහණෙනි, **න භික්ඛවේ අන්තො වස්සෙ චාරිකා චරිතබ්බා** යි මා විසින් සිකපදයක් පනවා ඇත. එසේ තිබියදී තෙපි මේ වස් කාලයේ කුමට චාරිකාවෙහි යෙදෙන්නහුද''යි විචාළ සේක. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සිදුවූ සියල්ල සැල කළෝය.

ලොවුතුරා බුදු වන මහා බෝධිසත්වයන් වහන්සේ-ලාට බුදු විය හැක්කේ දඹදිව මධ්‍ය දේශයේ ශ්‍රී මහා බෝධි මූලයේ වැඩ හිඳ භාවනා කිරීමෙනි. අන් තැනක හිඳ භාවනා කොට බුදුබව නොලද හැකිය. බෝධිමූලය එයට නිසි ස්ථානයය. එමෙන් ම රහත් වන පුද්ගලයන්-ටත් රහත් විය හැකි සුදුසු ස්ථාන ඇත්තේය. ඒ තැන්වලට පැමිණ භාවනා කිරීමෙන් ඒඒ අය රහත් වෙති. බුදුවරයන්ට මිස සෙස්සන්ට ඒඒ අයට සුදුසු තැන් නොදත හැකිය. එහෙත් රහත් වීමට තරම් පින් ඇත්තෝ ඉබේම තමතමන්ට සුදුසු තැනට පැමිණ

Scanned with CamScanner

භාවනා කොට රහත් වෙති. බොහෝ දෙනාට රහත් වීමට සුදුසු තැන් ද ඇත්තේය. අනුරාධපුරයේ රුවන්-වැලි මහ සෑය සමීපය එබඳු තැනකි. රුවන්වැලි මහ සෑයේ ගර්භ වේදිකාවේ සිට බලන කල පෙනෙන අවට භූමියේ කෙනකුට පතුල් දෙක තබා සිටිය හැකි තරමේ එක්එක් තැනක තිස් දහස බැගින් භික්ෂූන් වහන්සේලා රහත් වී ඇතැයි සංයුත්ත නිකාය අටුවාවේ කියා තිබේ. දුනුදු ඒ ප්‍රදේශය කරා ශීල සමාදනයට හා භාවනාවට බොහෝ දෙනා ඇදී යන්නේ බිමෙහි ඇති ඒ ගුණය නිසා විය හැකිය. ඉහත කී භික්ෂූන් වහන්සේලා පන්සියයගේ සිත ඒ පර්වතයට යොමු වූයේ ද එය ඔවුනට රහත් වීමට නිසි තැන බැවිනි.

දේවතා උපද්‍රවය නිසා හුන් තැන හැර ආ ඒ භික්ෂූන් වහන්සේලාට සුදුසු සෙනසුනක් බැලූ තථාගත-යන් වහන්සේට ඒ පර්වතය හැර ඔවුනට සුදුසු සතර පා ඇති පුටුවක් තැබීමට තරම් බිමකුදු නො පෙනිණ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔවුනට මේ **කරණීය මෙත්ත සූත්‍රය වදරා** ''මහණෙනි තොපට සුදුසු අන් තැනක් මේ දඹදිව් තලයේ නැත. තෙපි එහි ම යවු. එහි මහණදම් පිරීමෙන් තෙපි රහත් වන්නහුය. ඉදින් තෙපි දෙවියන්ගෙන් අභය කැමත්තහු නම් එහි ගොස් මාසයේ බණ අසන දින අටෙහි ගෙඩිය ගසා රැස් වී මේ සූත්‍රය කියවූ, මේ සූත්‍රයෙන් ම දහම් දෙසවු, මේ සූත්‍රයේ ධර්මයෙන් ම සාකච්ඡා කරවු, මෙය ම අනු-මෝදන් වවු, මේ මෛත්‍රී කර්මස්ථානය ම භාවනා කරවු. එසේ කරන කල්හි තොපට දෙවියෝ කරදර නොකරන්නහුය. ඒ දේවතාවෝ තොපට හිතවත් වන්නහුය''යි වදාළ සේක. භික්ෂූහු ඒ පර්වතයට ම

Scanned with CamScanner

ගොස් පිරිතක් වශයෙන් හා භාවනාවක් වශයෙන් මේ සූත්‍රය භාවිත කළහ. ඉන් පසු කලින් භික්ෂූන් අස්කර දැමීමට කරදර කළ දේවතාවෝ උන්වහන්සේලා කෙරෙහි පැහැදී ආරක්ෂා කරන්නටත් උපකාර කරන්නටත් වූහ. පැහැදුණා වූ දේවතාවෝ ඒ භික්ෂූන් වහන්සේලාගේ සෙනසුන් හැමදීම, පැන් සැපයීම් ආදි වත් ද කරන්නට වූහ. ඒ භික්ෂූන් වහන්සේලා කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි මෛත්‍රී භාවනා කොට එය ම පාදක කොට විදසුන් වඩා ඒ වස්කාලය ඇතුළත අර්හත්වයට පැමිණියෝය.

කරණීය මෙත්ත සූත්‍රය නම්වූ මේ සූත්‍රය විශේෂයෙන් කැලෑවල වෙසෙමින් මහණදම් පුරන භික්ෂූන් වහන්සේලාට ආරක්ෂාව පිණිස භාවිතයට දේශනය කරන ලද්දකි. සාමාන්‍යයෙන් ගිහි පැවිදි කාහටත් ආරක්ෂාව සඳහාත්, මෙලොව දියුණුව සඳහාත්, මරණින් මතු ස්වර්ගයෙහි ඉපදීම සඳහාත්, සසර දුකින් මිදී නිවන් සුවය ලැබීම සඳහාත් භාවිත කිරීමට සුදුසු සූත්‍රයෙකි.

මේ සූත්‍රයේ පළමුවන දෙවන ගාථා දෙකින් හා තුන්වන ගාථාවේ මුල් කොටසින් ද දැක්වෙන්නේ වනයේ වෙසෙන භික්ෂූන් පිළිපැදිය යුතු ආකාරයය. මෛත්‍රී භාවනාව කරන කවුරුන් විසිනුත් හැකි පමණින් එසේ පිළිපැදිය යුතුය. තුන්වන ගාථාවේ අග කොටසින් හා ඉතිරි ගාථාවලින් දැක්වෙන්නේ මෛත්‍රී භාවනාවය.

Scanned with CamScanner

## මෙම සූත්‍රය භාවිත කිරීමේ ප්‍රයෝජනය

මිනිසුන් අතර අන්‍යයන්ට අප්‍රිය පුද්ගලයෝ ද ප්‍රිය පුද්ගලයෝ ද ඇත්තාහ. පිරිසිදුවක් නැති, ගුණධර්ම නැති, පව්කම් වැඩි, නිතර නොමනා සිත්වලින් ම යුතු ව වෙසෙන පුද්ගලයා ජනයාට අප්‍රියය. ඔහු දැකීමටත්, තමන් වෙත පැමිණෙනවාටත්, ඔහු හා කථා කිරීමටත්, ඔහුට සැලකිල්ලක් කිරීමටත්, අන්‍යයෝ අකැමැතිය, එබඳු පුද්ගලයාට ගියගිය තැනදී ඇති වන්නේ නොයෙක් කරදර ය. පිරිසිදු ව වෙසෙන, ගුණධර්ම වැඩි, පව්කම් අඩු, යහපත් සිත්වලින් කල්යවන පුද්ගලයා ජනයාට ප්‍රිය ය. ඔහු දැකීමටත්, තමා වෙත පැමිණෙනවාටත්, ඔහු හා කථා කිරීමටත්, ඔහු ඇසුරු කිරීමටත්, ඔහුට සැලකීමටත් සෙස්සෝ කැමැත්තෝ ය. එබැවින් ඔහුට ගියගිය තැනදී ජනයාගෙන් සැලකිලි ලැබේ. භාවිතා කරන තැනැත්තා ජනප්‍රිය පුද්ගලයකු කිරීමේ බලයක් කරණීය මෙත්ත සූත්‍රයෙහි ඇත. එය භාවිතා කරන තැනැත්තා මිනිසුන්ටත්, දෙවියන්ටත්, අමනුෂ්‍යයන්ටත් ප්‍රිය පුද්ගලයෙක් වේ. ප්‍රියත්වය නිසා අමනුෂ්‍යයෝ ඔහුට කරදර නො කරති. මනුෂ්‍යයෝ ද ඔහුට කරදර නො කරති. ඒ ජනප්‍රිය පුද්ගලයාට ලැබෙන ආරක්ෂාවය. සූත්‍රය තේරුම් ඇති ව යමෙක් එය කියවනවා නම් එය මෛත්‍රී භාවනාව කිරීමක් ද වන්නේය. මෛත්‍රී භාවනාවට කියා ඇති අනුසස් මේ සූත්‍රය කීමෙන් ලැබේ. **අංගුත්තර නිකායේ ඒකාදසක නිපාතයේ** මෛත්‍රියේ අනුසස් එකොළොසක් වදරා ඇත්තේය. ඒ මෙසේය:

Scanned with CamScanner

**i. සුඛං සුපති**

බොහෝ ජනයා ඒ මේ අත පෙරළෙමින්, ගොරවමින්, කෙල පෙරමින් දුකසේ නිදති. මෛත්‍රිය වඩන්නහුට එසේ නොවී සැපසේ නිදිය හැකි වේ.

**ii. සුඛං පටිබුජ්ඣති**

බොහෝ දෙනා හිරි අරිමින්, ඇනුම් අරිමින්, හොඳ සිහියකුත් නැති ව නින්දෙන් අවදි වෙති. මෛත්‍රී භාවනාව කරන තැනැත්තා සමාපත්තියකින් නැගිටින් නාක් මෙන් සැපසේ නින්දෙන් නැගිටී.

**iii. න පාපකං සුපිනං පස්සති**

සෙස්සන්ට මෙන් නින්දේදී බිය වන නපුරු සිහින නො පෙනී පින්කම්, විහාර, බොධි, චෛත්‍යාදී යහපත් සිහින පමණක් පෙනේ.

**vi. මනුස්සානං පියො හොති**

මෙත් වඩන තැනැත්තා මල් පොකුරක් මෙන්, මැණිකක්, ස්වර්ණාභරණයක් මෙන් දකින්නා වූ මිනිසුන්ට ප්‍රිය වේ. දුටු විට අහක බලන්නට නො සිතේ.

**v. අමනුස්සානං පියො හොති**

මෙත් වඩන තැනැත්තා විශාඛ තෙරුන් වහන්සේ මෙන් අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වේ. විශාඛ තෙරුන් වහන්සේගේ කථාව මෙසේය: ඒ තෙරුන් වහන්සේ ගිහි කාලයේ දඹදිව පැළලුප් නුවර විසූ ධනවතෙකි. ඔහුට එහිදී 'මේ ලක්දිව චෛත්‍යවලින් අලංකාරය.

කසට පැහැති වස්ත්‍රයෙන් හෙවත් චීවරයෙන් බැබ-ලෙන්නේය, සෘතු ගුණය ඉතා හොඳය. කොතැනත් නිදිම - නිදිම කළ හැකිය. නොයෙක් තැන දහම් අසන්නටත් ඇතිය' යන මේ ආරංචිය ඇසිණ. එයින් ඔහුට ලක්දිවට යාමේ බලවත් ආශාවක් ඇති විය. ඔහු තමාගේ ධනය අඹුදරුවන්ට දී එක් කහවණුවක් පමණක් රෙදි කොණේ ගැට ගසා ගෙන ලක්දිව බලා පිටත් විය. මුහුදු තෙරට පැමිණි ඔහුට නැවක් නැති කමින් එහි එක් මසක් රැඳී සිටින්නට සිදු විය. වෙළඳා-මෙහි දක්ෂ වූ ඔහු එක් තැනකින් ගත් බඩු අන් තැනකට විකුණමින් ඒ මාසය තුළ කහවණු දහසක් උපයා ගත්තේය. මසකට පසු නැවක් ලැබ ඔහු ලක්දිවට පැමිණ ක්‍රමයෙන් අනුරාධපුරයේ මහා විහාරයට ගොස් පැවිද්ද ඉල්ලීය. පැවිදි කිරීම සඳහා සීමාවට කැඳවා ගෙන ගිය කල්හි හිණ තිබූ දහසක් කහවණු ඇති පසුම්බිය බිම හෙළීය. භික්ෂූන් වහන්සේලා එය දැක ''මේ කුමක් ද''යි ඇසූ කල්හි ''ස්වාමීනි, කහවණු දහසකැ''යි කීය. භික්ෂූන් වහන්සේලා 'උපාසකය, පැවිදි වීමෙන් පසු මේවා පරිහරණය නො කළ හැකිය. මේවාට කරන දෙයක් දැන් ම කරන්නැයැ'යි කීහ. ඔහු 'විශාඛ පැවිදි වන තැනට ආ අය හිස් අතින් නොයෙත්වා'යි කහවණු දහස සීමා මාලකයෙහි විසුරුවා දැමීය. ඔහු පැවිදි ව උපසම්පදාව ද ලබා පස්වසක් ගත කොට උභය ප්‍රාතිමෝක්ෂය ද පාඩම් කරගෙන පස්වන වස පවාරණය කොට එක් විහාරයක සිවු මස බැගින් විසීමට පටන් ගත්තේය. මෙසේ විහාරයෙන් විහාරයට යන්නා වූ විශාඛ භික්ෂූන් වහන්සේ එක් දවසක් සිතුල්පව් විහාරයට යන්නේ මංසන්ධියකට පැමිණ යා යුතු මග සිතමින් සිටිනා කල්හි පර්වතයෙහි වෙසෙන දෙවියෙක්

Scanned with CamScanner

අත දිගුකොට උන්වහන්සේට මග පෙන්වීය. තෙරුන් වහන්සේ සිතුල්පව් විහාරයේ සිවු මසක් වැස පසු දින උදෑසන යන්නට සිතා ගෙන සැතපුණහ. එද රාත්‍රියේ එහි සක්මන් මලුව කෙළවර මීදෙල්ල ගසෙහි වෙසෙන දෙවියා උන්වහන්සේ වැඩ සිටි විහාරයේ තරප්පු ලෑල්ලක හිඳ හඬන්නට විය. තෙරුන් වහන්සේ ''ඔබ කවුදැ''යි ඇසූ කල්හි ''ස්වාමීනි, මම මීදෙල්ල ගසේ දෙවියා වෙමි''යි කීය. ''කුමට හඬන්නෙහිදැ''යි ඇසූ කල්හි ''නුඹ වහන්සේ මේ විහාරයෙන් වැඩම කරන නිසායැ''යි කීහ. ''මා මෙහි විසීමෙන් ඔබට ඇති යහපත කුමක්දැ''යි විචාළ කල්හි ''ස්වාමීනි නුඹ වහන්සේ මෙහි වැඩ සිටින කල්හි මේ වනයේ දේවතාවෝ ඔවුනොවුන් සමගියෙන් වාසය කරන්නාහ. නුඹ වහන්සේ මේ විහාරයෙන් වැඩම කළ හොත් ඔවුහු පෙර සේ ම නැවතත් බැණ ගන්නට, කෝලාහල කරන්නට පටන් ගන්නාහ''යි කීය. තෙරුන් වහන්සේ ''ඉදින් මා මෙහි විසීමෙන් නුඹලාට පහසුවක් වන්නේ නම් යහපතැ''යි කියා නැවතත් සාර මසක් එහි ම වාසය කොට යාමට අදහස් කළ කල්හි දේවතාවා නැවතත් කරුණු කීය. තෙරුන් වහන්සේ ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් නැවතත් එහි ම විසූහ. යාමට සිතනසිතන සෑම දිනක ම දෙවියා පැමිණ එසේ කළ බැවින් උන්වහන්සේට දිවිහිමි-යෙන් එහිම වාසය කරන්නට සිදු විය. තෙරුන් වහන්සේ දේවතානුකම්පාවෙන් එහි වැස එහිම පිරිනිවියහ. මේ විශුද්ධිමාර්ගයේ එන කථාවෙකි. තෙරුන් වහන්සේ දෙවියන්ට, අමනුෂ්‍යයන්ට ප්‍රිය වූයේ උන්වහන්සේ මෛත්‍රී භාවනාව කළ බැවිනි.

Scanned with CamScanner

සමථ භාවනා සතළිසක් ඇත. එයින් තිස් නවයක් භාවනාවලින් යහපතක් සිදු වන්නේ කරන තැනැත්තාට පමණය. මෛත්‍රී භාවනාව එසේ නොවේ. කරන තැනැත්තාට හා මෛත්‍රී භාවනාවට ලක්වන අන්‍යයන්ටත් යහපතක් වන එක ම භාවනාව මෛත්‍රී භාවනාවය. මෛත්‍රී භාවනාවෙන් අන්‍යයන්ට යහපතක් වන්නේ එය හොඳින් දැන ක්‍රමානුකූල ව අන්‍යයන්ට යහපතක් සිදු වන පරිදි කළහොත් ය.

vi. **දේවතා රක්ඛන්ති**

මෙත් සිතින් වෙසෙන පුද්ගලයා මාපියන් විසින් දූදරුවන් රක්නාක් මෙන් දෙවියෝ ආරක්‍ෂා කරති.

vii. **නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති**

මෛත්‍රිය ඇතියහුගේ ශරීරය ගින්නෙන් නො දැවේ. ඔහුගේ ශරීරයට විෂ ඇතුළු නො වේ. ඔහුගේ ශරීරය ආයුධවලට නො කැපේ.

viii. **තුවටං චිත්තං සමාධියති**

භාවනාවෙහි යෙදෙන කල්හි මෛත්‍රියෙන් වෙසෙන්නහුගේ සිත ඉක්මනින් සමාධි වේ.

ix. **මුඛවණ්ණො විප්පසීදති**

මෙත් සිත පවත්වන්නහුගේ මුහුණ පැහැපත් වේ.

x. **අසම්මුල්හො කාලං කරොති**

මෛත්‍රිය වඩන්නේ සිහි මුළාවෙන් නො මැරේ. බරපතල මරණ වේදනාවක් නැති ව නින්ද ගියාක් මෙන් මරණයට පත් වේ.

Scanned with CamScanner

xi. උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති

මෛත්‍රී ධ්‍යානය ලබා ගත් පුද්ගලයාහට විදසුන් වඩා අර්හත්වයට නොපැමිණිය හැකි වුවහොත් ඔහු නින්දට වැටුනාක් මෙන් සුවසේ කලුරිය කොට බ්‍රහ්ම ලෝකයේ උපදී.

මේ අංගුත්තර නිකායේ ඒකාදසක නිපාතයේ දක්වෙන මෛත්‍රී ආනිසංස එකොළොසය.

## ගුණ ලැබෙන ලෙස පිරිත් කියයුතු අන්දම

පිරිතෙන් හොඳින් ම ගුණ ලැබෙන්නට නම් නොවරදවා හොඳින් පාඩම් කරගෙන පිරිත්වල අර්ථ අදහස් ද දැන ගෙන කිය යුතුය. දැනට පිරිත් කියන අය අතර ඒවායේ තේරුම් දැන ගෙන කියන අය ගිහියන් අතර තබා පැවිද්දන් අතර ද ඉතා හිඟය. තේරුමක් නැති ව කියන පිරිතේ බලය අඩුය. එහෙත් ගුණයක් නො ලැබෙන්නේ ද නො වේ. පිරිත නොවරදවා පාඩම් කර ගෙන හරියට කියතහොත් එයින් ද තරමකට ගුණ ලැබේ. එසේ ගුණ ලැබෙන්නේ වචනවල හෙවත් ශබ්දවල යම්කිසි බලයක් ඇති නිසාය. වචනවල ඇති බලය එතරම් මහත් එකක් නොව සුළු බලයෙකි. වාර බොහෝ ගණනක් කීමෙන් ඒ බලය වැඩි වේ. පිරිත්, සෙත් කවි, මන්ත්‍ර ආදිය වාර බොහෝ වාර ගණනක් කිය යුත්තේ ඒ නිසාය. කියන වාර වැඩි වූ තරමට ගුණය වැඩි වේ. පිරිත් හඬෙහි බිය ගන්වන බලය, බිය දුරු කරන බලය, වශීකරණ බලය හෙවත් අන්‍යයන්ගේ සිත් සතුටු කරන සිත් ඇද ගන්නා බලය, ශරීරයේ වා - පිත් - සෙම් යන

හුන්දෙස් ගමනය කිරීමේ බලය, ශරීරයේ සප්ත ධාතූන් වර්ධනය කිරීමේ බලය, නොයෙක් වේදනා සහ නොයෙක් රෝග දුරු කිරීමේ බලය, සැප සම්පත් ලබා දීමේ බලය, අමනුෂ්‍යයන්ගෙන්, සොරුන්ගෙන්, සතුරන්ගෙන්, සර්පයන්ගෙන් ආරක්‍ෂා කිරීමේ බලය, ග්‍රහ අපල, ඇස්වහ-කටවහ ආදී දෝෂ දුරුවීමේ බලය යනාදී නොයෙක් බල ඇත්තේය.

මන්ත්‍රවලට ගෙන ඇති වචනවල හොඳ නරක දෙක ම සිදු කිරීමේ බල ඇත්තේය. රෝග සුව කිරීමේ බල, රෝග ඇති කිරීමේ බල, සිත් සන්සුන් කිරීමේ බල, සිත් වික්ෂිප්ත කොට උමතු කිරීමේ බල, අමනුෂ්‍යයන් දුරු කිරීමේ බල, ඔවුන් ගෙන්වීමේ බල, සමගි වූවන් භේද කිරීමේ බල, භේද වූවන් සමගි කිරීමේ බල, ඉන්නා තැනින් පන්නා දැමීමේ බල, අන්‍යයන්ගේ සිත් ඇද ගන්නා බල යනාදී අනෙකප්‍රකාර බල මන්ත්‍රවල සහ කවි වල ඇත්තේය.

පිරිත් අතුරෙන් කරණීය මෙත්ත සූත්‍රය බෙහෙවින් වශීකරණ බලය ඇති සූත්‍රයෙකි. එය බොහෝ කොට භාවිතා කිරීමෙන් ජනප්‍රිය පුද්ගලයකු විය හැකිය.

අන් සෑම පිරිත් සූත්‍රයකට වඩා ලස්සනට, මිහිරියට කිය හැකි සූත්‍රය කරණීයය. එහි වඩාත් වශීකරණ බලය ඇත්තේ ඒ නිසාය. දික් අකුරු කෙටි අකුරු අල්ප අකුරු මහප්‍රාණ අකුරු වරදවන්නේ නැතිව, වචන මැදින් බිඳින්නේ නැතිව, එක් වචනයක් අග හෝ මුල හෝ අකුරක් අන් වචනයකට එකතු නොකර, වෘත්තය නොබිඳ, නියම තාලයට මේ සූත්‍රය කියන්නට පුරුදු කර ගත යුතුය. මේ ගාථා තාලයට මිස මන්ත්‍ර කියන

තාලයට වේගයෙන් නො කිය යුතුය. එසේ, නියම තාලයට නොවරදවා මේ සූත්‍රය කියත හොත්, එහි අර්ථ නොතේරෙතත් ගුණ ලැබෙණු ඇත. සමහර විට වරදවා කියන පිරිත්වලින්, මන්ත්‍රවලින් දෙස් ඇති වන්නට ද බැරි නැත. තේරුම් නොදන වුව ද පිරිත හරියට කියත හොත් ශබ්දයෙන් ලැබෙන ගුණය ලැබෙන්නේය.

## කරණීය මෙත්ත සූත්‍රයේ තේරුම

**1. කරණීයමත්ථකුසලෙන**
**යං තං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කො උජූ ච සුජූ ච**
**සුවචො චස්ස මුදු අනතිමානි**

ශාන්ත වූ නිවන ලබා ගෙන නිවනට පැමිණ දුක් කෙළවර කරනු කැමැති සත්පුරුෂයා ඒ සඳහා කළ යුත්ත කියමි: ඔතැනි නොවන, අලස නොවන ශීලාදී, ගුණධර්ම පිරීමට සමතකු විය යුතුය.

නොදත් දෙය දන්නා සේ, නො කරන දෙය කරන සේ, කරන වරද නො කරන සේ පෙනී සිටින කපටියකු නොවී අවංක පුද්ගලයකු විය යුතුය. හොඳට ම අවංක පුද්ගලයකු විය යුතුය. ධර්මය - විනය පිළිගන්නා වූ, ගුරුන්ගේ අවවාද මුදුනින් පිළිගන්නා කෙනකු විය යුතුය. ධර්මයට, විනයට, ගුරුන්ගේ අවවාදයට, පට-හැණි ව කථා කරන, නොයෙක් ප්‍රශ්න ඉදිරිපත් කරන, දිරූ දරකඩක් බඳු නොවී මෘදු පුද්ගලයකු විය යුතුය. ජාති ගෝත්‍රාදිය හිස මුදුනට ගත්, තද මානය ඇතියකු නොවී නිහතමානී පුද්ගලයකු විය යුතුය.

Scanned with CamScanner

**2. සන්තුස්සකො ච සුභරො ච**
**අප්පකිච්චො ච සල්ලහුකවුත්ති**
**සන්තින්ද්‍රියො ච නිපකො ච**
**අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො**

බොහෝ බඩු නොසොයන තමාට ඇති දෙයකින් පමණක් සතුටුව සිටින්නකු විය යුතුය. ඇති දෙය නරකය, ලද දෙය නරකය කියා හොඳහොඳ දේ නො සොයනසුළු බැවින් දයකයන්හට උපස්ථාන කිරීමට පහසු කෙනකු විය යුතුය. කෙළවරක් නැතිව නොයෙක් වැඩ පටලවා නොගන්නා වූ කෙනෙකු විය යුතුය. බොහෝ ප්‍රත්‍යයන් රැස්කර නොගන්නා වූත්, යන විට ගෙන යාමට බරක් නැත්තා වූත්, පිරිකර ස්වල්පයක් පමණක් පරි-හරණය කරන්නකු විය යුතුය. චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ට හමු වන රූපාදීන් කෙරෙහි නොඇලෙන ශාන්ත ඉන්ද්‍රිය-යන් ඇතියකු විය යුතුය. තියුණු නුවණැතියකු විය යුතුය. සඟ මැදදී වැඩිමහල්ලන් ගැන නොසලකා ඉදිරියට පැන වැඩ කරන, කථා කරන, කලබල කාරයකු නොවිය යුතුය. නෑ පවුල්වලට, දයක පවුල්වලට ඇලුම් කරන, සතුටු විය යුතු කරුණේදී ඔවුන් හා සතුටු වන, කණගාටු විය යුතු කරුණේදී ඔවුන් හා ශෝක කරන පුද්ගලයකු නො විය යුතුය.

**3. න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි**
**යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං**

නුවණැතියන් විසින් දොස්කියන, නින්දවට ලක් කරන ස්වල්ප වූ හෝ වරදක් නොකළ යුතුය.

Scanned with CamScanner

භාග්‍යවතුන් වහන්සේ මෙතෙකින් වදරා ඇත්තේ ශාන්ත පදය යි කියන ලද නිර්වාණය ප්‍රත්‍යක්ෂකර වාසය කරනු කැමති වූ ද, නිවනට පැමිණීම සඳහා පිළිවෙත් පුරනු කැමති වූ ද, විශේෂයෙන් වනගත ව වෙසෙන භික්ෂූන් විසින් ද සාමාන්‍යයෙන් භාවනාවෙහි යෙදී වාසය කරනු කැමැති සැමදෙනා විසින් ද පිළිපැදිය යුතු ආකාරයය. ඉදිරියට කියැවෙන්නේ ඒ භික්ෂූන්ට ඇති වූ දේවතා බිය දුරුකර ගැනීම සඳහා ද, විදර්ශනාවට පාදක කර ගැනීම සඳහා ද කළ යුතු භාවනාවක් වශයෙන් මෛත්‍රී භාවනාව කළ යුතු ආකාරය ය.

**සුඛිනො වා ඛෙමිනො හොන්තු**
**සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා**

'සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා: රාජ චෝර භයාදියෙන් මිදුනෝ වෙත්වා: සතුටු සිත් ඇත්තෝ වෙත්වා'. මේ කෙටියෙන් මෛත්‍රී භාවනාව දැක්වීම ය. මතු ගාථාවලින් දැක්වෙන්නේ විස්තර වශයෙන් භාවනා කරන ආකාරය ය.

4. **යෙ කෙචි පාණභූතත්ථි**
**තසා වා ථාවරා වා අනවසෙසා**
**දීඝා වා යෙ මහන්තා වා**
**මජ්ඣිමා රස්සකාණුකථූලා**

5. **දිට්ඨා වා යෙ ච අද්දිට්ඨා**
**යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ**
**භූතා වා සම්භවෙසී වා**
**සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා**

තෘෂ්ණාව අප්‍රහීණ බැවින් බිය වන සත්වයෝ ද, තෘෂ්ණාව හා භය ප්‍රහාණය කළ රහත්හු ද, දික් ශරීර ඇති සත්වයෝ ද, මහත් ශරීර ඇති සත්වයෝ ද, මධ්‍යම ශරීර ඇති සත්වයෝ ද, කෙටි ශරීර ඇති සත්වයෝ ද, කුඩා ශරීර ඇති සත්වයෝ ද, වට ශරීර ඇති සත්වයෝ ද, දුක ඇති සත්වයෝ ද, නොදුටු සත්වයෝ ද, දුර වෙසෙන සත්වයෝ ද, ළඟ වෙසෙන සත්වයෝ ද, උපන් සත්වයෝ ද, මවු කුසවල සහ බිත්තරවල මතු ඉපදීමට සිටින සත්වයෝ ද යන සකල සත්වයෝ ම සුවපත් වෙත්වා! මේ සත්වයන් කොටස්වලට බෙදා මෙත් වඩන ආකාරයය.

6. න පරො පරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

කෙනෙක් අනිකකු නො රවටත්වා! වඤ්චා නොකෙරෙත්වා! අනිකකු පහත් කොට නො සලකත්වා! රෝෂයෙන් හා ක්‍රෝධයෙන් සත්වයෝ අන්‍යයන් දුකට පත් වෙනවාට, අන්‍යයන්ට දුක් ලැබෙනවාට කැමති නො වෙත්වා!

මතු දැක්වෙන සත්වන ගාථාවෙන් දැක්වෙන්නේ මෛත්‍රිය පැවැත් විය යුතු ආකාරය.

7. මාතා යථා නියං පුත්තං
ආයුසා එකපුත්තමනුරක්ඛෙ
ඒවං පි සබ්බභූතෙසු
මානසං භාවයෙ අපරිමාණං

එක් පුතකු ඇති මව යම් සේ ඒ පුතා කෙරෙහි තමාගේ සිත පවත්වන්නී ද, එසේ සියලු සත්වයන් කෙරෙහි, අප්‍රමාණ සත්වයන් කෙරෙහි මෛත්‍රී චිත්තය වැඩිය යුතුය, පැවැත්විය යුතුය.

8. මෙත්තං ච සබ්බලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියං ච
අසම්බාධං අවෙරං අසපත්තං

සකල ලෝකයෙහි ම උඩ යට සරස වෙසෙන අප්‍රමාණ සත්වයන්ට යම් කිසිවකු නිසා බාධාවක් ඇති නොවන ලෙස, තමා තුළ වෛර චේතනා ඇති නොවන ලෙස, තමාට සතුරන් ඇති නොවන ලෙස මෛත්‍රී චිත්තය වැඩිය යුතුය, පැවැත්විය යුතුය. (මෙහි අදහස ගැඹුරුය.)

9. තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවතස්ස විගතමිද්ධො
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු

සිටින, හිඳින, නිදන සැම අවස්ථාවේ ම නිදිමතින් තොර ව සිටින තාක් මේ මෛත්‍රී චිත්තය පැවැත් විය යුතුය. එසේ වාසය කිරීම මේ ධර්මයෙහි උත්තම වාසයකැයි කියනු ලැබේ.

දසවන ගාථාවෙන් දැක්වෙන්නේ විදර්ශනාවය. ලෝකෝත්තර ධර්මයන්ය. එය ගැඹුරුය. පහසුවෙන් තේරුම් කළ නො හැකිය.

Scanned with CamScanner

10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනෙන සම්පන්නො
කාමේසු විනෙය්‍ය ගෙධං
න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී' ති

'සත්වයෝ සුවපත් වෙත්වා යි' සත්වයන් අරමුණු කොට භාවනා කළ නුමුත් පරමාර්ථ වශයෙන් සත්වයකු, පුද්ගලයකු ඇතය යන දෘෂ්ටියට නොබැස විදර්ශනා කොට, ලෝකෝත්තර ශීලයෙන් සිල්වත් ව, ලෝකෝත්තර ශීලසම්ප්‍රයුක්ත ශ්‍රෝතාපත්ති දර්ශනය ලබා, සකෘදගාමි, අනාගාමි මාර්ග ලබා, ඉතිරි ක්ලේශයන් ප්‍රහාණය කොට අර්හත්වයට පැමිණ නැවත නූපදනා කෙනකු විය යුතු ය.

මේ කරණීය මෙත්ත සූත්‍රයේ ගාථාවල සාමාන්‍ය අදහසය. පාලි වචන ඇති සැටියට පදගතාර්ථ ලියුව හොත් සාමාන්‍ය ජනයාට තේරුම් ගැනීම ඉතා දුෂ්කර වන බැවින් මෙසේ අදහස පමණක් ලියන ලදී.

**කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි මෛත්‍රී භාවනාව කළ යුතු අන්දම**

**කෙටි ක්‍රමය:**

සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
සියලු සත්වයෝ බියවලින්, අන්තරාවලින් මිදෙත්වා!
සියලු සත්වයෝ සතුටු සිත් ඇත්තෝ වෙත්වා!

Scanned with CamScanner

කායිකාබාධ නැති ව විසීම සුවපත් වීම ලෙසත්, සොර, සතුරු බිය, අමනුෂ්‍ය බිය ආදියෙන් මිදීම බියවලින් සහ අන්තරායවලින් මිදීම ලෙසත්, සිතට කරදර නැති ව විසීම සතුටු සිත් ඇති ව විසීම ලෙසත් සැලකිය යුතුය.

## විස්තර භාවනා ක්‍රමය

දිගු කය ඇති සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
මහත් කය ඇති සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
මැදුම් කය ඇති සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
මිටි වූ සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
කුඩා වූ සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
වට වූ කය ඇති සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
දැක ඇති සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
දැක නැති සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
දුර සිටිනා සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
ළඟ සිටිනා සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
එකෙක් අනිකකුට වඤ්චා නො කෙරෙත්වා!
එකෙක් අනිකකු පහත් කොට නො සලකත්වා!
එකෙක් අනිකකුට දුක් නො දෙත්වා!

දිගු කය ඇති සත්වයෝ නම් සර්පාදීහුය. මහත් කය ඇති සත්වයෝ නම් දියෙහි මහා මත්ස්‍යයන් හා ගොඩ ඇත් ආදීහුය. මැදුම් කය ඇති සත්වයෝ නම් අශ්ව, ගවාදීහුය. මිටි සත්වයෝ නම් ඒ ඒ ජාතිවල ප්‍රමාණයට නොවැඩුණු සත්වයෝය. කුඩා සත්වයෝ නම් උකුණු - මකුණු, මැසි - මදුරු ආදීහුය. වට වූ සත්වයෝ නම් කැස්බෑ, ඉදිබු ආදීහුය. මේ සත්ව කොටස් දසයට ලෝකයේ දේව මනුෂ්‍යාදී සියල්ලෝ ම

අයත් වෙති. භාවනා කරන්නවුන්ට අවුල් වැඩි විය හැකි බැවින් සූත්‍රයෙහි **ථස, ථාවර, භූත, සම්භවෙසී** යන වචනවලින් දක්වෙන සත්වයෝ නොගන්නා ලදහ.

## දානය හා මෛත්‍රී භාවනාව

දානය, මෛත්‍රී භාවනාව යන මේ දෙක්හි ඇත්තේ එක ම පරමාර්ථයෙකි. එනම් අන්‍යයන් සුවපත් කිරීමය. දන් දීමෙන් කරනුයේ ආහාරපානාදී වස්තුවලින් අන්‍ය-යන්ට සැපයක්, සතුටක් ඇති කර දීමය. මෛත්‍රී භාවනාවෙන් කරනුයේ සිතින් අන්‍යයන්ට සැපයක් ඇති කර දීමය. ආහාරපානාදී වස්තූන් දීමෙන් සැපය සතුට ඇති කර දිය හැක්කේ ටික දෙනකුට පමණෙකි. රටක සිටින සැම දෙනකුට ම නොදිය හැකිය. ලෝකයේ සිටින සැමට ම නොදිය හැකිය. ඇතැම් සත්වයන්ට කවරා-කාරයකින්වත් නොදිය හැකිය. එහෙත් මෙත් වැඩීම ලෝකයේ සිටින දුටු - නොදුටු, සියලු සත්වයන් සඳහා ම කළ හැකිය. එබැවින් දානමය කුශලයට වඩා මෛත්‍රී භාවනාමය කුශලය මහත්ය. ඒ බව තථාගතයන් වහන්සේ විසින් මෙසේ වදාරන ලදී:

**යො භික්ඛවෙ පුබ්බණ්හසමයං ඔක්ඛාසතං දානං දදෙය්‍ය, යො මජ්ඣන්තිකං සමයං ඔක්ඛාසතං දානං දදෙය්‍ය, යෝ සායණ්හසමයං ඔක්ඛාසතං දානං දදෙය්‍ය, යො වා පුබ්බණ්හසමයං අන්තමසො ගද්දූහනමත්තම්පි මෙත්තං චිත්තං භාවෙය්‍ය යො වා මජ්ඣන්තිකං සමයං අන්තමසො ගද්දූහනමත්තම්පි මෙත්තං චිත්තං**

Scanned with CamScanner

භාවෙය්‍ය, යො ච සායණ්හසමයං අන්තමසො ගද්දූහන-මත්තම්පි මෙත්තං චිත්තං භාවෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

(සංයුත්ත නිකාය, ඛන්ධ වග්ගය, ඔපම්ම සංයුත්තය සතරවන සූත්‍රය)

මේ සූත්‍රයේ අදහස 'මහ බත් සැළි සියයකින් දන් දීමට වඩා දෙනකගේ තන පුඩුව වරක් ඇද කිරි දෙවා ගන්නා තරම් සුළු කාලයක් කරන මෛත්‍රී භාවනාව මහත් ඵලය' යනුයි. දනයට වඩා මෛත්‍රී භාවනාව උසස් බව දක්වා වදාළ තවත් සූත්‍ර ගණනක් ඇත්තේය.

මෙසේ මෛත්‍රී භාවනාවෙහි බොහෝ අනුසස් කියන්නේ ඒ භාවනාවට ලක්වන සත්වයන්ට යහපතක් වන සැටියට ම කරන භාවනාව ගැනය. 'භාවනා කරමි'යි කියා යම් කිසිවක් පාඩම් කර ගෙන කී පමණින් එයින් අන්‍යයන්ට වන යහපතක් නැත. එබඳු භාවනා-වල වටිනාකමක් නැත. අන්‍යයන්ට යහපතක් වන පරිදි මෛත්‍රී භාවනාව කිරීමත් අමරු වැඩෙකි. එය හොඳින් උගෙන කරුණු තේරුම් ගෙන ක්‍රමානුකූල ව කළ යුත්තකි.

දනයේ වටිනාකම ඇති වන්නට නම් ප්‍රතිග්‍රාහක-යාට ප්‍රයෝජනයක් වන පරිදි, සතුටක් ලැබෙන පරිදි දනය දිය යුතුය. ප්‍රතිග්‍රාහකයාට කිසි ප්‍රයෝජනයක් නැති, එය පිළි ගැනීමට යාමෙන් කරදරයක් සහ නොසතුටක් පමණක් ඇති වන දන ද ඇත්තේය. ඒවායේ ද වටිනාකමක් නැත. බොහෝ බෞද්ධයෝ කෙසේ හෝ දෙනවා මිස මේවා ගැන නො දනිති. ප්‍රයෝජනයක් ලබන හොත් එක් භික්ෂුවකුට පමණක්

Scanned with CamScanner

ප්‍රයෝජනයක් ලැබිය හැකි, සමහර විට එපමණවත් නැති සුළු දෙයක් බොහෝ භික්ෂූන් වැඩම කරවා දෙති. එබඳු දනවල කිසි වටිනාකමක් නැත. එබඳු දීමනා දක්නට ලැබෙන්නේ මරණ පොලවලය. ඒවා ගැනත් බෞද්ධයන් කල්පනා කළ යුතුය.

## මෙත්තා චේතො විමුත්තිය

**මෙත්තා චේතො විමුත්ති** යනු නැවතනැවත වඩා දියුණු කොට ධ්‍යාන භාවයට පමුණුවන ලද මෛත්‍රීයය. එහි අනුසස් දක්වෙන සූත්‍රයක් මෙසේය:

**යානි කානි චි භික්ඛවෙ ඕපධිකානි පුඤ්ඤකිරිය වත්ථූනි සබ්බානි තානි මෙත්තාය චේතො විමුත්තියා කලං නාග්ඝන්ති සෝළසිං, මෙත්තා යෙව තානි චෙතො විමුත්තිං අග්ගහෙත්වා භාසති ච තපති ච විරොචති ච**

**තේරුම:**

''මහණෙනි මනුෂ්‍ය - දිව්‍ය සම්පත් ලබා දෙන යම් පමණ පින්කම් ඇත්තේ ද ඒ සියල්ල **මෙත්තා චේතො විමුත්තියෙන්** දහසයෙන් පංගුවෙන් දහසයෙන් පංගුවකුදු නොවටන්නේය. මෙත්තා චෙතො විමුත්තිය ම ඒ සියල්ල යටපත් කොට බැබලෙන්නේය''.

මෙහි දහසයෙන් පංගුවෙන් දහසයෙන් පංගුව යයි කියනුයේ යම් කිසිවක් දහසයට බෙද එයින් කොටසක් නැවත දහසයට බෙද මෙසේ දහසය වාරයකට බෙදීමෙන් ලැබෙන සුළු කොටසට ය.

# අංගුලිමාල පිරිත

## පූජ්‍ය පියදස්සි නායක හිමිපාණන් විසිනි.

අංගුලිමාල හාමුදුරුවෝ සැවත් නුවර පිණ්ඩපාතය සඳහා යද්දී දරු ප්‍රසූතියකින් දුක් විඳින කාන්තාවක දුටහ. උන්වහන්සේ දන් වළඳ බුදුරදුන් වෙත ගොස් තමා දුටු දෙය පැවසූහ. එවේලෙහි බුදුරජහු අංගුලිමාල මාහිමියනට මේ පිරිත කියා දුන්හ.

දුක් විඳින කාන්තාව සමීපයට ගිය අංගුලිමාල තෙරණුවෝ තිරයකින් වෙන් කොට පිළියෙල කරන ලද ආසනයක වැඩ හිඳ අංගුලිමාල සූත්‍රය දේශනා කරමින් සත්‍ය ක්‍රියා කළහ. ඒ මොහොතේ ම ඉතා පහසුවෙන් ඕ තොමෝ දරුවා බිහි කළාය.

මේ අංගුලිමාල සූත්‍රයේ ප්‍රතිඵල අදත් දැක්ක හැකිය. එක් බෞද්ධ ප්‍රසව දෙස්තර මහතෙක්, දරු ප්‍රසූතියක් පිළිබඳ ව නිවසට හෙදි සොහොයුරියන් දැනුම් දුන් විට වාහනයෙන් රෝහල කරා යන්නේ අංගුලිමාල සූත්‍රයත් කියමිනි. ඇතැම් විටෙක එසේ ගිය විට දරුවා බිහි ව ඇති හෙයින් කළ හැකි ප්‍රතිකාරයන් නැති තරම් ය. ඇතැම් දිනෙක එතුමා ලෙඩාට සුවය දෙන්නේ, බෙත් කරන්නේ අංගුලිමාල සූත්‍රය කියමිනි.

Scanned with CamScanner

මේ අංගුලිමාල සූත්‍රය, පිරිත් පොතෙහි ඇතුළත් ව නැත. වෙන නොයෙක් බුද්ධ - භාෂිත හෝ ශ්‍රාවක - භාෂිත හෝ නොවන සූත්‍ර එහි ඇතුළත් ව ඇත. එහෙත් අංගුලිමාල සූත්‍රය මවු පක්ෂයට ඉතා අවශ්‍ය ය. භික්ෂූන් වහන්සේ ලබා ගත නොහැකි අවස්ථාවක දී වුව ද ගිහියන් විසින්, කාන්තාවන් විසින්, මේ සූත්‍රය ;කියා සත්‍ය ක්‍රියා කොට ගැබිණි කාන්තාවකට සෙත සලසා දිය හැකි වෙනුවා ඇත.

ආරක්ෂාව සඳහා බුදුරදුන් විසින් පිරිත් වශයෙන් වදාළ, අංගුලිමාල මාහිමියන් විසින් බුදුරදුන්ගෙන් අසා ඉගෙනගත්, බුද්ධ වචන ඇතුළත්, අංගුලිමාල සූත්‍රය මජ්ඣිම නිකාය නම් වූ බණ පොතෙහි 86 වැනි සූත්‍රය හැටියට දැක්ක හැකිය:

**1. පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨාධොවනං**
**උදකම්පි විනාසෙසි - සබ්බමෙව පරිස්සයං**

**2. සොත්ථිනා ගබ්භවුට්ඨානං - යඤ්ච සාධෙති තං ඛණෙ,**
**ථෙරස්සංගුලිමාලස්ස - ලොකනාථෙන භාසිතං**
**කප්පට්ඨායිං මහතෙජං - පරිත්තං තං භණාමහෙ**

**3. යතො'හං භගිණි අරියාය-ජාතියා ජාතො නාභිජානාමි සංචිච්ච පාණං ජීවිතා'වොරොපෙතා-තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සා'ති:**

1 යම් ආසනයක වැඩ හිඳ අංගුලිමාල සූත්‍රය යමකු දේශනා කළේ නම් ඒ ආසනය සෝදගත් ජලයෙන් පවා සියලු උපද්‍රවයන් විනාශ කළ හැකි වන්නේ ය.

Scanned with CamScanner

මේ අංගුලිමාල සූත්‍රය, පිරිත් පොතෙහි ඇතුළත් ව නැත. වෙන නොයෙක් බුද්ධ - භාෂිත හෝ ශ්‍රාවක - භාෂිත හෝ නොවන සූත්‍ර එහි ඇතුළත් ව ඇත. එහෙත් අංගුලිමාල සූත්‍රය මවු පක්ෂයට ඉතා අවශ්‍ය ය. භික්ෂූන් වහන්සේ ලබා ගත නොහැකි අවස්ථාවක දී වුව ද ගිහියන් විසින්, කාන්තාවන් විසින්, මේ සූත්‍රය ¹කියා සත්‍ය ක්‍රියා කොට ගැබිණි කාන්තාවකට සෙත සලසා දිය හැකි වෙනුවා ඇත.

ආරක්ෂාව සඳහා බුදුරදුන් විසින් පිරිත් වශයෙන් වදාළ, අංගුලිමාල මාහිමියන් විසින් බුදුරදුන්ගෙන් අසා ඉගෙනගත්, බුද්ධ වචන ඇතුළත්, අංගුලිමාල සූත්‍රය මජ්ඣිම නිකාය නම් වූ බණ පොතෙහි 86 වැනි සූත්‍රය හැටියට දක්ක හැකිය:

1. **පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨානධොවනං**
   **උදකම්පි විනාසෙසි - සබ්බමෙව පරිස්සයං**

2. **සොත්ථිනා ගබ්භවුට්ඨානං - යඤ්ච සාධෙති තං**
   **ඛණෙ,**
   **ථෙරස්සංගුලිමාලස්ස - ලොකනාථෙන භාසිතං**
   **කප්පට්ඨායිං මහතෙජං - පරිත්තං තං භණාමහෙ**

3. **යතො'හං භගිණි අරියාය-ජාතියා ජාතො නාභිජානාමි**
   **සංචිච්ච පාණං ජීවිතා'වොරොපෙතා-තෙන සච්චෙන**
   **සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සා'ති:**

1 යම් ආසනයක වැඩ හිඳ අංගුලිමාල සූත්‍රය යමකු දේශනා කළේ නම් ඒ ආසනය සෝදගත් ජලයෙන් පවා සියලු උපද්‍රවයන් විනාශ කළ හැකි වන්නේ ය.

Scanned with CamScanner

2 ලෝකනාථ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් අංගුලිමාල මාහිමියනට උගන්වන ලද කල්පයක් මුළුල්ලේ තෙදබල මහිමය පවත්නා වූත් මොහොතකින් සුවසේ දරු ප්‍රසූතිය ඇති කරන්නා වූත් බලයක් ඇති අංගුලිමාල සූත්‍රය අපි දැන් දේශනා කරමු.

3 "නැගනියෙනි, මම ආර්ය ජාතියෙන් උපන්නාට පසු (ආර්ය ජාතිය යන්නෙන් අදහස් කෙරෙන්නේ අඟුල්මල් මාහිමියන් පැවිද්ද ලබා සසුන්ගත වූවාට පසු) දැනදැන, ජීවත් වන්නා වූ ප්‍රාණියකුගේ ජීවිතයක් නැතිකළ බවක් නො දනිමි: මේ සත්‍ය ක්‍රියාවෙන් ඔබට සෙතක් ම වේවා! උපත බලාපොරොත්තුවෙන් ගර්භයේ සිටින දරුගැබට සෙතක් ම වේවා"!

(මේ සූත්‍රය හත් වරක් කියා සෙත් පතනු මැනැවි. පිරිත් පැන් බොන්නට දී පිරිත් නූල කරවටේ දමන්න).

Scanned with CamScanner

# තිස් පැයේ රාත්‍රී පිරිත් දේශනා පිළිවෙල

පූජ්‍ය මාගන්දනමුල්ලේ බුද්ධසෝම හිමියන් විසිනි.

පිළිගත් සම්ප්‍රදයට අනු ව තැනූ පිරිත් මණ්ඩපයෙහි මලෝලොඹු එල්වා, ලද පස් මල් (අබ, සුණුසල්, විළඳ, ඊතණ, පිච්ච මල් කැකුළු) මණ්ඩපය තුළ ඉස, දෙරටු සතරෙහි පහන් දල්වා, සුවඳ අල්වා දැහැත් වට්ටිය දී

**විපත්ති පටිබාහාය - සබ්බසම්පත්තිසිද්ධියා**
**සබ්බදුක්ඛවිනාසාය - පරිත්තං බ්‍රෑථ මඞ්ගලං**

**. . . -පෙ- . . . සබ්බභයවිනාසාය සබ්බරෝගවිනාසාය පරිත්තං බ්‍රෑථ මංගලං** යන ගාථා කියා පිරිතට ආරාධනා කළ යුතු ය.

## මහ පිරිත

ඉක්බිති පිරිස පන්සිල්හි පිහිටුවා, ධර්මාවවාදයක් කොට, මඟුල් බෙර වාදනය නිම වූ පසු **සමන්තා චක්කවාලේසු** ආදී වශයෙන් දෙවියන්ට ආරාධනා කොට, දේශක පිරිසගේ අත්වලට සඳුන් කිරි - පැන් දී, විශේෂ පිරිත් හුය අල්වා ගෙන පළමු ව දේශක

Scanned with CamScanner

වහන්සේලා සියලු දෙනා ම එක් ව වැඳගෙන නමස්කාරය තෙවරක් කියා, විජිනි පත් අතට ගෙන පිරිත පුරණ දෙනම සහ සෙසු පිරිස සම්ප්‍රදායානුකූල ව

**ඉති'පි සො භගවා . . .**

**ස්වාක්ඛාතො භගවතා . . .**

**සුපටිපන්නො භගවතො . . .**

යනුවෙන් තෙරුවන් වඳින ගාථාවක් ද

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරා . . (පටිච්ච සමුප්පාදය)**

**බාහුං සහස්සමභිනිම්මිත . . (ජය මඞ්ගල ගාථා)**

යන ගාථා සජ්ඣායනා කිරීමෙන් පසු

**මඞ්ගල සූත්‍රය**

**රතන සූත්‍රය**

**කරණීය මෙත්ත සූත්‍රය**

**මහා ජය මඞ්ගල ගාථා (මහාකාරුණිකොනාථො** යන ගාථාවෙන් අරඹා, **නක්ඛත්ත - යක්ඛ - භූතානං** යන ගාථාවෙන් අවසන් වන ගාථා පන්තිය සජ්ඣායනා කිරීමෙන් මහ පිරිත නිම වනවාත් සමඟ ම මණ්ඩපයේ සිව් කොනේ කලින් එල්වා තැබූ ගොක් කොළ සතර පිරිත් හුය මැදි කොටැ

**සබ්බෙ බුද්ධා බලප්පත්තා - පච්චෙකානඤ්ච යං බලං අරහංතානඤ්ච තෙජෙන - රක්ඛං බන්ධාමි සබ්බසො** යන ගාථාව කියා ගැට සතරක් ගැසිය යුතුය. එය උදේට පිරිත අවසන් කරන මොහොතේ ලිහා දැමිය යුතුය.

**මහ පිරිතෙන් පසු**

මහ පිරිතෙන් පසු ව, ආතුරයාට හෝ පිරිසට හෝ සඳුන් කිරි පැන් දී, අත් පිරිසිදු කොටැ සකස් කළ සාමාන්‍ය තුන් නූල අල්වා ගැනීමට දිය යුතුය.

Scanned with CamScanner

අනතුරු ව දෙනමක් යුගාසනයේ හිඳ **සරණාගමණ**-යේ පටන් **ධජග්ග සූත්‍රය** තෙක් සුමිහිරි හඬින්, එක අකුරේ කියවෙන පරිදි නො වරද්ද, පද නො කඩා, කරුණාපෙරදූරිව පළමු බණවර සජ්ඣායනා කළ යුතුය.

ඉක්බිති **මහා කාශ්‍යප බොජ්ඣඩග** පිරිතේ පටන් **ඉසිගිලි සූත්‍රය** තෙක් දෙවන බණවර වෙන දෙනමක් විසින් සජ්ඣායනා කළ යුතුය.

ඉන් පසු හේවිසි කරවා, සුවඳ දුම් අල්වා අන්‍ය දෙනමක් විසින් **ධම්මචක්ක සූත්‍රය** මනා ලෙස ශාන්ත ව සජ්ඣායනා කළ යුතුය.

ඉක්බිති වෙන දෙනමක් විසින් (භික්ෂූන් අඩු නම් කියූ දෙනම විසින් හෝ) **සච්ච - විභඩ්ගය** තෙක් සූත්‍ර හත දේශනා කර අවසන් වීමට විනාඩි පහකට පෙර **ආටානාටිය** දේශනා කිරීමට වෙන සතරනමක් මණ්ඩපයට වැඩමවා සිටිය යුතුය. දේශකයන් වහන්සේලා **ආටානාටිය සූත්‍ර** දේශනාව අවසාන කිරීමට විනාඩි කීපයකට පෙර සියලු ම භික්ෂූන් මණ්ඩපයට වැඩිය යුතුය. එසේ වැඩි පසු දේශනාවේ අග **සුගතොවාදය** වූ **උග්ගණ්හාථ භික්ඛවෙ - පෙ - අභිනන්දුත්ති** යන කොටස කිය යුතුය. අනතුරු ව සැම දෙනා විසින් ම තෙරුවන් වැඳ, **කරණීය මෙත්ත** සූත්‍රය, **අටවිසි පිරිත**, **ජිනපඤ්ජරය** හා **මහා ජය මඩ්ගල** ගාථාවන්ගෙන් පිරිත හමාර කළ යුතුය. (මුලින් ගැට ගැසූ ගොක්කොළ මෙවේලේ ලිහිය යුතුය.) ඉක්බිති දෙවියන්ට හා මළගිය ඥාතීන්ට පින් දී, පිරිත් පැන් සහ නූල් පිරිසට දිය යුතුය. නිවසේ අට කොණ ගල් - වැලි වල දමා, පැන් ඉස ආරක්ෂාව සැලසිය යුතුය.

Scanned with CamScanner

පිරිත් කීමේ දී එක්එක් ආචාර්ය පරම්පරාවල සුලු-සුලු වෙනස් කම් දක්නට ලැබේ. එක් පරම්පරාවක නමස්කාරයෙහි පටන් **සරණාගමන**, **දස සික්ඛා**, **සාමණෙර ප්‍රශ්න**, **ද්වත්තිංසාකාර**, **අතීත ප්‍රත්‍යවෙක්ෂා**, **දස ධම්ම**, **මඞ්ගල**, **රතන**, **කරණීය මෙත්ත** සූත්‍රයන් හා **මහා ජය මඞ්ගල** ගාථාවන් සියලු සඞ්ඝයා එකවර එකට පටන් ගෙන එක අකුරෙන් නවත්වා, පද නො කඩා ඉතා මිහිරි හඬින් **මහ පිරිත** දේශනා කරති.

අනතුරු ව දෙනමක් විසින්, සම ව සුමිහිරි ව ඛන්ධ සූත්‍රයේ පටන් ධජග්ගය තෙක් ද, අන්‍ය දෙනමක් විසින් දෙවන බණ වරද දේශනා කළ ඉක්බිති ධම්මචක්ක සූත්‍රයේ පටන් මහා සමය සූත්‍රයේ කෙළවර තෙක් සතර නමක් යුග බෙදී දේශනා කරති. යළිත් ආළවක සූත්‍රයේ පටන් සූත්‍ර පස දෙනමක් විසින් දේශනා කෙරෙන අතර ආටානාටිය සිව් නමක් විසින් දේශනා කෙරේ. පළමු ක්‍රමයට වඩා මේ ක්‍රමයේ දී **මහ පිරිත** පද නො කඩා, අර්ථ පැහැදිලි වන සේ කීම පහසුය. මෙහි තවත් වෙනසක් නම් මහ පිරිතෙන් පසු මුලින් කියවුනු සූත්‍ර හැර **ඛන්ධ** පිරිතෙන් පටන් ගෙන කීම ය.

ගිහි පිරිතක් කීමේ දී උසස් ප්‍රතිඵල ලැබීමට නම් යටත්පිරිසෙයින් එක් දිනක්වත් ඊට පෙව්ය යුතුය. පිරිතට පෙර දින සිට ආජීවාෂ්ටමක සීලය සමාදන්ව, සුරාවෙන් පමණක් නොව සුරාවට ඇතුළත් වන දුම් බීමෙන් ද, දුම් කොල හැපීමෙන් ද වැළකී නිර්මාංශ-භක්ෂික විය යුතුය. දේශපාලන ආදී වාද - භේදවලින්

Scanned with CamScanner

තොර ව, එම කථාවලින් ද වැළකී ඉතා ශාන්ත - දාන්ත, මෙත් - කරුණා ගුණවලින් හා නො කැළඹුනු සිතින් යුතු ව මිහිරි හඬින් සජ්ඣායනා කළ යුතුය.

පිරිත් අසන දයක-දායිකා පිරිස ද ඇලීම්-ගැටීම්වලින් තොර ව, සුරා - සූදුවලින් වැලකී, ඝොෂා කිරීමෙන් වැලකී, තෙරුවන් කෙරෙහි ගෞරවාදර සහිත ව, නොවිසිරුනු සිතින් යුතු ව, ශාන්තව පිරිත් ඇසිය යුතුය.

— නිමි —

පිට කවර චිත්‍රය : අශ්විනී කාරියවසම්

ISBN - 955 - 24 - 0158 - 4

සමනළ මුද්‍රණ කර්මාන්ත.
28, දන්තුරේ පාර,
පිළිමතලාව.

Scanned with CamScanner